# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# 2024

# ප්‍රගති වාර්තාව

# පටුන


| | | |
|---|---|---|
| 01. | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 1-12 |
| 02. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 13-21 |
| 03. | ජාතික තරුණ සේවා සභාව | 23-30 |
| 04. | ජාතික යොවුන් සේනාංකය | 33-47 |
| 05. | නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය | 49-56 |
| 06. | ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 57-62 |
| 07. | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය | 63-69 |
| 08. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 71-76 |
| 09. | ක්‍රීඩා වෛද්‍ය ආයතනය | 77-85 |
| 10. | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | 87-97 |

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

**01. හැඳින්වීම**

අභිමානවත් තුලිත පෞරුෂත්වයකින් යුත් ජවසම්පන්න තරුණ ප්‍රජාවක් හා ජවසම්පන්න, නීරෝගීමත් සහ විනයගරුක සමාජයක් බිහිකිරීම සඳහා ක්‍රියාශීලී පරපුරක් නිර්මාණය කිරීමට රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුකූලව තරුණ ප්‍රජාව හා ක්‍රීඩාව කේන්ද්‍ර කරගනිමින් තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යයන් සිදු කෙරේ. ක්‍රීඩා හා යෞවන කටයුතු ලෙස පැවැති අමාත්‍යාංශ නාමය අංක 2412/08-2024 දරණ හා 2024 නොවැම්බර් මස 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය.

**02. දැක්ම**

'ජවසම්පන්න තාරුණ්‍යය තුළින් තිරසර ලෙස සංවර්ධිත දේශයක්'

**03.මෙහෙවර**

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහිකිරීම හා විනය ගරුක, ක්‍රීඩාශීලී සමාජයක් ඇතිකිරීම තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමට දායක වීම.

**04.ප්‍රධාන කාර්යයන්**

01. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා තරුණ කටයුතු සහ ක්‍රීඩා විෂයන්ට සහ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
02. අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
03. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යය භාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියළු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
04. රැකියා විරහිත තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා දත්ත පද්ධතියක් පිහිටුවීම, ඔවුන් ස්ථානගත කිරීම සඳහා රැකියා බැංකුවක් පිහිටුවීම සහ විරැකියාව ක්‍රමානුකූලව අවම කිරීම සඳහා මාර්ගගත වේදිකාවක් හරහා අදාළ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම
05. තරුණ පරපුරේ අභිලාෂයන් ඉටු වන ජාතික වැඩපිළිවෙළක් අරමුණු කර ගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
06. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
07. විවිධ ජාතීන් හා ආගම් අතර අවබෝධය වර්ධනය කිරීම සඳහා තරුණ හුවමාරු වැඩසටහන් නිර්මාණය කිරීම
08. තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු
09. තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලීත්වය සමාජ පිළිගැනීමක් ඇති වන සහ ඔවුන්ට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකි වන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම
10. තරුණ ව්‍යවසායකයින් බිහි කිරීමට පියවර ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම
11. උසස් පෙළ සමත්, නමුත් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් විය නොහැකි වූ තරුණ ප්‍රජාව ඉලක්ක කර වෘත්තීය නිපුණතාවයක් සහිත තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම
12. දැනටමත් මාර්ගගත ක්‍රමය ඔස්සේ විදේශ විනිමය උපයන නිදහස් වෘත්තික (Freelance) තරුණ තරුණියන්ට ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම

13. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටුයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
14. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම
15. ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණය ප්‍රවර්ධනය කිරීම
16. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකි වන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
17. ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගී වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම
18. පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම
19. ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේදී තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම
20. ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම
21. ක්‍රීඩා සමිති සංවිධාන සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම
22. ක්‍රීඩා සඳහා විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික මට්ටම, පෝෂණය සහ පුහුණුවට අදාළ උපකරණ ලබා දීම සඳහා පාසල් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩසටහන් ක්‍රියාක්මක කිරීම
23. ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍රකොට ගනිමින් පළාත් නවය සඳහාම නවීන ක්‍රීඩා පාසල් ජාලයක් ඇති කිරීම
24. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයන්ට අදාළ කටයුතු සහ එම සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

## 05. අදාළ ආයතනික හා නෛතික රාමුව

අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන

01. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
02. ජාතික තරුණ සේවා සභාව
03. ජාතික යොවුන් සේනාංකය
04. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
05. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
06. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
07. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
08. උත්තේජක මර්දන නියෝජ්‍යායතනය
09. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය ( අංක 2412/08-2024 දරණ විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අංශය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට 2024.11.25 දින සිට පවරා ඇත.)

## 06. ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්

- ක්‍රීඩාවට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත (2019 අංක 24)
- ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා පනත (1973 අංක 25)
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත (1999 අංක 17)
- ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33)
- ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)
- ජාතික යොවුන් සේනාංක පනත (2002 අංක 21)
- ළමයින් හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥා පනත(1939 අංක 48)

**07.** මානව සම්පත් පැතිකඩ

**අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලය 2024.12.31**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු(අතිරික්තය) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 44 | 33 | 10 |
| තෘතීයික | 05 | 03 | 02 |
| ද්විතියික | 228 | 193 | 36 |
| ප්‍රාථමික | 55 | 54 | 01 |
| එකතුව | 332 | 283 | 49 |

**08.** ජාතික ක්‍රීඩා අරමුදල

ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ධෛර්ය දීම,ක්‍රීඩාව දියුණු කිරීම, සංවර්ධනය කිරීම සඳහා ආධාර හා අනුබල දීමේ අරමුණින් 1973 අංක 250 දරණ ක්‍රීඩා පනතේ විධි විධාන අනුව ජාතික ක්‍රීඩා අරමුදලින් පෝෂණ දීමනා ගෙවීම්, ජාත්‍යන්තර ජයග්‍රහණ වෙනුවෙන් සිදුකරන ත්‍යාග ලබාදීම් ක්‍රීඩා සංගම් සඳහා මුදල් ලබාදීම් සිදුකරනු ලබයි. ජාතික ක්‍රීඩා ප්‍රභවය වනුයේ භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන හා ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් ලබන වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදනයි. ක්‍රීඩා අරමුදලේ අරමුණු පහත පරිදි වේ.

i. ජාතික ක්‍රීඩා අරමුදල මගින් ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමට අදාළ ප්‍රතිපත්ති හා පසුවිපරම් ක්‍රමවේදය සැකසීම.
ii. ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ක්‍රීඩා අරමුදලේ ප්‍රතිපාදන කඩිනමින් ලබාදිම.
iii. ක්‍රිඩා අරමුදල සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අනුග්‍රාහකත්වය ලබා ගැනීම තුළින් ක්‍රීඩා අරමුදල ශක්තිමත් කිරීම සහ ක්‍රිඩක ක්‍රීඩිකාවන් වැඩි ප්‍රමාණයකට අරමුදල යටතේ ප්‍රතිපාදන ලබාදීම.
iv. පදක්කම් ලාභීන් අගයමින් විශේෂ තිළිණ ලබා දිම තුළින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් තුළ උද්යෝගයක් ඇතිකිරිම.

**09.2024.12.31** දිනට ළඟාකරගත් ඉලක්ක

I. වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ පිහිණුම් තටාක සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
II. CR & FC ක්‍රීඩාංගණයේ ආලෝක පද්ධතිය සංවර්ධනය කිරිම ව්‍යාපෘතිය.
III. ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගැනීම සඳහා චීනය, රුසියාව, හංගේරියාව, ඉන්දුනීසියාව, මාලදිවයින, අකුණු අප්‍රිකාව හා කසකස්තානය යන රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම සඳහා කෙටුම්පත් ගිවිසුම් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරිම හා අදාල මූලික පියවර ගැනිම.
IV. 2019, 2021, 2022, 2023 යන වර්ෂ සඳහා ජනාධිපති සම්මාන ක්‍රීඩා පැවැත්වීමට අදාළ මූලික පියවරයන් ගැනීම හා සම්මාන ලාභීන් තෝරා අවසන් කිරීම
V. ක්‍රීඩා රෙගුලාසි ප්‍රකාරව ජාතික ක්‍රීඩා සම්මේලන වලට අදාළව 2024.01.01 සිට මේ දක්වා ජාතික තේරීම් කමිටු 20ක් පත් කර ඇත.

VI. 2024.09.30 දිනට සඳහා ජාතික ක්‍රීඩා සංගම් විසින් ජාත්‍යන්තර තරඟාවලි, සම්මන්ත්‍රණ, පුහුණුවීම් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 403 හා නිලධාරීන් 401දෙනකු ගරු. අමාත්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව තරඟාවලි සහ වැඩමුළු/සම්මන්ත්‍රණ සඳහා සහභාගී කරවා ඇත.

VII. සංචාරක ක්‍රීඩා (Sport Tourism) නගා සිටුවීමේ මූලික පියවරයන් ලෙස Football, Rugby, Chess සහ Table Tennis ජාත්‍යන්තර තරඟාවලි ශ්‍රී ලංකාව තුළ පැවැත්වීම සඳහා අවශ්‍ය අනුග්‍රාහීන් ලබා දීම.

VIII. ක්‍රීඩා සංශෝධිත පනත, ක්‍රීඩා අධිකාරී පනත හා ක්‍රීඩා විශ්වවිද්‍යාල පනත කෙටුම්පත් කිරීම අවසන් අදියරේ පවතී.

IX. ක්‍රීඩා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ඕස්ට්‍රේලියාව සහ මෙරට අතර තිබූ අවබෝධතා ගිවිසුම ඉදිරි වසර 03ක් සඳහා නැවත ගිවිසුම්ගත වීම.

**තරුණ විෂය**

**2024 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා විශේෂ ජයග්‍රහන**

01. **ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා**

හඳුනාගත් මධ්‍යස්ථාන කිහිපයක දැනට පළමු හා දෙවන කණ්ඩායම් සඳහා පුහුණුව පවත්වාගෙන යනු ලබයි. විස්තර පහත පරිදි වේ.

පළමු කණ්ඩායමේ ශිෂ්‍යයින් = 502
පළමු වසරේ සමාසික පරීක්ෂණ දෙක සහ දෙවන වසරේ පළමු සමාසික පරීක්ෂණය මේ වන විට පවත්වා ඇත.
දෙවන කණ්ඩායමේ ශිෂ්‍යයින් = 920
පළමු වසරේ පළමු සමාසික පරීක්ෂණය සම්පූර්ණ කර ඇත

තෙවන කණ්ඩායම බඳවාගැනීමට නියමිතව ඇත.





02. **ජාතික තරුණ ප්‍රතිපත්තිය**

ජාතික තරුණ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීමේ අරමුණින් දිස්ත්‍රික්කයකට 02ක් වන ආකාරයට ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGD) 50ක් පවත්වා අවසන්ව ඇති අතර සංජානන සමීක්ෂණයක් (Perception Survey) හරහා ද තොරතුරු රැස්කිරීමට නියමිතය. ඒ සඳහා සංකල්ප පත්‍රිකාව (Concept Note) උපදේශකවරුන් දෙදෙනා විසින් සකස් කර අවසන්ව ඇත.

ජාතික තරුණ ප්‍රතිපත්තිය සකස් කිරීමේ ඉදිරි කටයුතු සඳහා මූල්‍යමය සහයෝගය ලබාදීමට UNFPA ආයතනයේ මූල්‍යමය දායකත්වය ලබාගැනීමටඅපේක්ෂා කෙරේ.

ඒ අනුව දැනට සකස් කර ඇති සංකල්ප පත්‍රිකාව අධ්‍යයනය කර ඉදිරි කටයුතු සැලසුම් කිරීමට එම ආයතනය එකඟ වී ඇත.

**10.** මානව සම්පත් සංවර්ධනය **2024.12.31**

| අනු අංකය | දිනය | පුහුණු පාඨමාලාව | සහභාගි වූ නිලධාරියා | පාඨමාලාව පැවැත් වූ ආයතනය |
|---|---|---|---|---|
| 01 | 2024.01.22 to 2024.01.23 | Public Procurement Procedures | (01)පී.ජේ.සමන් පීරිස් මහතා- කළමනාකරණ සේවා නිලධාරි<br>(02) ඉරේෂා උමයන්ගනී මෙය- සංවර්ධන නිලධාරි | නිපුනතා සංවර්ධන අරමුදල |
| 02 | 2024.05.09 to 2024.05.10 | Capacity Building Training | (01)එච්.එම්.ඒ.කුමාරසිංහමහතා සහකාර ලේකම්- ප්‍රසම්පාදන<br>(02)අයි.යූ.වික්‍රමසූරිය මහතා සහකාර ලේකම්-පාලන | SLIDA |
| 03 | 2024.06.10-2024.06.14 | General Conduct and Disciplinary Procedure in Public Service | අරුනි අභයගුණවර්ධන මිය | SLIDA |
| 04 | 2024.06.20 | ගිණුම් ක්‍රම | සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියේ 17 දෙනෙකු සඳහා (කාර්යක්ෂම කඩඉම් විභාගය සඳහා) | මෙම අමාත්‍යාංශය තුල |
| 05 | 2024.06.22 | කාර්යාල ක්‍රම | සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියේ 24 දෙනෙකු සඳහා (කාර්යක්ෂම කඩඉම් විභාගය සඳහා) | රු.10,000.00 |
| 06 | 2024.06.24 | ගිණුම් ක්‍රම | සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියේ 16 දෙනෙකු සඳහා (කාර්යක්ෂම කඩඉම් විභාගය සඳහා) | -නොමිලේ- |
| 07 | 2024.06.25 | IT | සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියේ 17 දෙනෙකු සඳහා (කාර්යක්ෂම කඩඉම් විභාගය සඳහා) | -නොමිලේ- |
| 08 | 2024.06.26 | IT | සංවර්ධන නිලධාරීන් III ශ්‍රේණියේ 14 දෙනෙකු සඳහා (කාර්යක්ෂම කඩඉම් විභාගය සඳහා) | -නොමිලේ- |
| 08 | 2024.07.10 | ප්‍රසම්පාදනය හා විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුව | (01)එස්.ඒ.ඩී.පී.මනෝරිකා මිය,ප්‍ර.ක.සේ.නි<br>02. පී.ජේ.සමන් පීරිස් මහතා, කළ.සේ.නි<br>03. පී.ඒ.එස්.එච්.ජයසේකර මිය<br>04. ඩී.එන්.එච්.විජේසූරිය මිය<br>05. අයි.යූ.බලසිංහ මිය | -නොමිලේ- |

| | | | | |
|---|---|---|---|---|
| | | | 06. ඩී.එස්.ඊ.සමරසේකර මිය<br><br>07. එල්.පී.කේ.පෙරේරා මිය<br><br>08. එස්.එම්.සී.සී.පෙරේරා මිය<br>09. යූ.පී.එස්.දිල්හානි මිය<br><br>11. එම්.එන්.මධුමාලි මිය<br><br>11. පී.ආර්.එන්.හර්ෂනී මිය<br><br>12. එස්.එම්.ඒ.ජේ.නදීශානි මෙය<br>13. කේ.ඩබ්.එම්.සී.රත්නායක මයා | |
| 09 | 2024.08.08 සහ 2024.08.09 | කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව | 01.ආර්.ඒ.ජේ.චන්ද්‍රසිරි මහතා<br>02.කේ.ජේ.නිරෝෂනි මිය | රු.20,000.00 |
| 10 | 2024.08.12 | නව විගණන පනත හා විගණන ගැටළු නිරාකරණය කිරිම | 01. එස්.එම්.ඒ.ජේ.නදීශානි මෙය<br>02. ජී.ආර්.එන්.හර්ෂණී මිය | රු.14,000.00 |
| 11 | 2024.08.22 සහ 2024.08.23 | විශ්‍රාම වැටුප් | 01.ඩබ්.පී.ඩී.ප්‍රියදර්හනී මිය | රු.13,000.00 |
| 12 | 2024.09.27 සහ 2024.09.28 | Work shop on advance Excel | 01.එස්.ඊ.සමරසේකර මිය<br>02. එම්.එන්.මධුමාලි මිය | රු.33,000.00 |
| 13 | 2024.10.30 | අල්ලස් හෝ දූෂණ චෝදනා පිටු දැකීමට අදාළව අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන-2024 | නිලධාරීන් 150 දෙනෙකු සඳහා | -නොමිලේ- |

**11.**සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය **2024.12.31** දිනට

| වැඩ සටහෙන් නම | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට වියදම මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | සමුච්චිත භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන | 1500 | 507 | 65 |

**12.**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනිමේ කාර්යසාධනය **2024.12.31** දිනට

| **විස්තරය** | **වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)** | **2024.12.31 දිනට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය | % |
| පුනරාවර්තන වියදම | 683.3 | 489.5 | 71.32 |
| ප්‍රාග්ධන වියදම | 1534.2 | 531.07 | 34.61 |
| එකතුව | 2220.5 | 1020.57 | 45.94 |

**13.2024 වර්ෂය තුළ ලබා ගත් ජයග්‍රහණ.**

- 2024 ප්‍රංශයේ පැරිස් හි පැවති පැරාලිම්පික් තරගාවලියේ F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් සමිත දුලාන් විසින් රිදී පදක්කම දිනා ගැනීම.
- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරගාවලියේ දී F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් **ලෝක වාර්තාවක් සමඟින් සමිත දුලාන් විසින් රන් පදක්කම** දිනා ගැනීම.
- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරගාවලියේ දී මීටර් 100 ඉසව්වෙන් එම්.ජී.නුවන් ඉන්දික විසින් ලෝකඩ පදක්කම දිනා ගැනීම.
- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරගාවලියේ දී යගුලිය විසිකිරීමේ ඉසව්වෙන් පාලිත බණ්ඩාර විසින් ලෝකඩ පදක්කම දිනා ගැනීම.
- ජෝර්දානයේ පැවති පැරාලිම්පික් ටේබල් ටෙනිස් තරගාවලියේ දී පී.ඩී.එස්.දිනේෂ් ප්‍රියන්ත විසින් රන් පදක්කම දිනා ගැනීම.
- මොරොක්කෝවේ පැවති 2024 ග්‍රෑන්ඩ් ප්‍රික්ස් ලෝක පැරා මලල ක්‍රීඩා තරගාවලියේ දී රන් පදක්කම් 02 ක් හා රිදී පදක්කම් 05 ක් දිනා ගැනීම.
- ඩුබායි හි පැවති ග්‍රෑන්ඩ් ප්‍රික්ස් පැරාලිම්පික් මලල ක්‍රීඩා තරගාවලියේ දී රන් පදක්කම් 02 ක් රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- 21 වන ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලියේ දී රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02 ක් පදක්කමක් දිනා ගැනීම.
- එක්සත් අරාබි එමීර් හි පැවති කණිෂ්ඨ ග්‍රෑන්ඩ් ප්‍රික්ස් මලල ක්‍රීඩා තරගාවලියේ දී රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- 2024 ජපානයේ ඔසාකා හි පැවති මලල ක්‍රීඩා තරගාවලියේ දී එච්.කේ.කාලිංග කුමාරගේ විසින් රන් පදක්කමක් හා ජපානයේ ටෝකියෝ හි පැවති මලල ක්‍රීඩා තරගාවලියේ දී රිදී පදක්කමක් දිනා ගැනීම.
- පළමු ආසියානු සහය දිවීමේ ශූරතාවලියේ දී පිරිමි සහය දිවීමේ කණ්ඩායම විසින් රන් පදක්කම හා කාන්තා සහය දිවීමේ කණ්ඩායම විසින් රිදී පදක්කම දිනා ගැනීම.
- තායිවානයේ පැවති විවෘත මළල ක්‍රීඩා තරගාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා තරුශි කරුණාරත්න විසින් මීටර් 400 හා මීටර් 800 ඉසව්වෙන් රන් පදක්කම් 2 ක් දිනා ගැනීම.
- චීනයේ මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් දිනා ගැනීම
- 19 වන ස්පාඤ්ඤ ජාත්‍යන්තර මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා කාලිංග කුමාරගේ විසින් රිදී පදක්කමක් දිනා ගැනීම.
- කොරියාවේ පැවති 2 වන ආසියානු හෙල්ල විසි කිරීමේ තරගාවලියේ දී රන් පදක්කමක් හා ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීම.
- බහමාස් හි පැවති මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් දිනා ගැනීම
- මාලදිවයිනේ පැවති 6 වන ආසියානු තරගාවලියේ දී කාන්තා කණ්ඩායම විසින් රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02ක් දිනා ගැනීම.
- ඉරානයේ පැවති 32 වන ෆාජ් ජාත්‍යන්තර තරගාවලියේ දී බැඩ්මින්ටන් ක්‍රීඩක හසිත අනුරුද්ධ විසින් හා විරේන් නෙත්තසිංහ විසින් ලෝකඩ පදක්කම් 02ක් දිනා ගැනීම.
- IFBB ආසියානු කායවර්ධන ශූරතා තරගාවලියේ දී රිදී පදක්කම් 03 ක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.

- ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම විසින් 2024 ආසියානු ශූරතාවය දිනා ගැනීම.
- ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම විසින් නවසීලන්තය සමඟ පැවති ටෙස්ට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීම
- තායිලන්තයේ පැවති U 15 & U 20 මල්ලවපොර තරඟාවලියේ දී නෙත්මි අහිංසා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම
- 20 න් පහළ කාන්තා වොලිබෝල් කණ්ඩායම විසින් අනුශූරතාවය දිනා ගැනීම.
- තායිලන්තයේ පැවති ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලියේ දී චාමර නුවන් ධර්මවර්ධන විසින් රන් පදක්කමක් දිනා ගැනීම
- තායිලන්තයේ පැවති ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලියේ දී ශ්‍රී ලංකා කණ්ඩායම විසින් රිදී පදක්කම් 04 ක් හා ලෝකඩ පදක්කම් 04 ක් දිනා ගැනීම.
- ෆීජී හි පැවති 2024 පොදු රාජ්‍ය මණ්ඩලීය (කණිෂ්ඨ,ජ්‍යෙෂ්ඨ,තරුණ) තරඟාවලියේ දී කේ.ඒ.අශේන් සචින්ත විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- ලෝක කැරම් තරඟාවලිය සඳහා සහභාගී වූ කණ්ඩායම විසින් කාන්තා හා පිරිමි ඒකල කණ්ඩායම් විසින් රිදී පදක්කම් 02 ක් හා කාන්තා හා පිරිමි යුගල කණ්ඩායම් විසින් ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීම.
- ශ්‍රී ලංකා කණ්ඩායම විසින් ආසියානු නෙට්බෝල් අනුශූරතාවය දිනා ගැනීම.
- තායිලන්ත ASBC බොක්ෂිං ආසියානු එලයිට් පිරිමි ශූරතා තරඟාවලියේදී පසිඳු උමයංග මිහිරාජ් ක්‍රීඩකයා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- බොට්ස්වානා හි පැවති ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරඟාවලියේදී ජයග්‍රහණ ලබා ගැනීම
- බංගලාදේශයේ පැවති Yonex Sunrise International Challenges 2024 තරඟාවලියේදී බැඩ්මින්ටන් ක්‍රීඩක විරේන් වෙත්තසිංහ විසින් රන් පදක්කමක් හා බැඩ්මින්ටන් ක්‍රීඩිකාවන් වන ඉසුරි අත්තනායක හා සිතුමි සිල්වා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.

## 14. අපේක්ෂිත ප්‍රධාන ඉලක්ක 2025 -2028

- ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තරුණ විරැකියාව පහත හෙළීම
- දළ ජාතික නිෂ්පාදනයට ක්‍රීඩා ආර්ථිකයේ දායකත්වය ඉහල නැංවීම
- ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබා ගත හැකි ක්‍රීඩා තරග සඳහා සහභාගිත්වය 25% කින් හා ඔලිම්පික් හා පොදු රාජ්‍ය මණ්ඩලීය පදක්කම් සංඛ්‍යාව 20 දක්වා වැඩි කිරීම
- නිරෝගිමත් ජන සමාජයක් උදෙසා සෑම පුරවැසියෙක්ම ශාරීරික ක්‍රියාකාරකමකට හෝ ක්‍රීඩාවකට යොමු කිරීම
- ද්විපාර්ශවීය අවබෝධතා ගිවිසුම් තුළින් විදේශ රටවල් සමඟ ක්‍රීඩා හා තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

# 2024

## ප්‍රගති වාර්තාව

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### 01.හැඳින්වීම

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, 1970 දි අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන, 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.

මේ වන විට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් නොනිමි මෙහෙවරක යෙදෙන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, පසුගිය දශක කිහිපයක් වූ සිය ඉතිහාසයේ ක්‍රීඩාව හා බැදුණු අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වී ඇත.

### 02.දැක්ම

"ක්‍රීඩාවේ සංවර්ධනය තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම."

### 03.මෙහෙවර

ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නිරෝගී, විනයගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහිකිරීමත් මගින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතිය බවට පත්කිරිම.

### 04.අරමුණු

01. සමාජයේ සියළුම ස්ථරයන්ට ක්‍රීඩාව සඳහා යොමුවීමට අවකාශය ලබා දීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායිතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.
02. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහණ අත් කර ගැනීම.
03. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙන යා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.
04. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.
05. ක්‍රීඩා සංගම් නියාමනය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ඇති කිරීම.

### 05.ප්‍රධාන කාර්යයන්

#### 01. මානව සම්පත් සංවර්ධනය

- ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දිම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශිය හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරඟවලට යොමුකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ක්‍රීඩා පුහුණුකරුවන්ට හා ක්‍රීඩා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබාදීම.
- විදේශ පුහුණුකරුවන් හරහා ශ්‍රී ලාංකික පුහුණුකරුවන්ට පුහුණුව ලබාදීම.
- ක්‍රීඩා නිලධාරින්ට නව තාක්ෂණය හඳුන්වාදිම සඳහා වැඩමුළු සංවිධානය කිරිම.
- දේශිය හා විදේශිය ක්‍රීඩා විශේෂඥයන් ලවා ක්‍රීඩා නිලධාරින්ට හා පුහුණුකරුවන්ට ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්විම.

**02.** යටිතල පහසුකම් සංවර්ධනය

- අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම හා දෙපාර්තමේන්තුව සතු ක්‍රීඩා සංකීර්ණ පවත්වා ගෙනයාම.
- ලංකාවේ සෑම පළාතකම ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගන සංවර්ධනය හා නවීකරණය.
- ග්‍රාමීය හා පාසල් ක්‍රීඩාපිටි සංවර්ධනය.

**06.** මානව සම්පත් පැතිකඩ **:**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 17 | 09 | 08 | - |
| තෘතියික | 23 | 07 | 16 | - |
| ද්විතියික | 254 | 176 | 78 | - |
| ප්‍රාථමික | 101 | 79 | 22 | - |
| **එකතුව** | **395** | **271** | **124** | **-** |

**07.**සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංක ය | වැඩසටහනේ නම | වෙන්ක ළ මුදල (රු.මිලි) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තු ව (රු.මිලි) | **2024.12.31** ට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| 1 | 219-02-02-17-2001<br>පලාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම | 777.00 | 777.00 | 340.00 | 42.6 | 94.3% |
| 2 | 219-2-2-2104-31<br>දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමිය | 100.00 | 100.00 | 0.00 | - | 0.3% |
| 3 | 219-02-02-17-2104-66<br>ශාන්ත ජෝශප් වාස් විද්‍යාලයේ ක්‍රීඩා සංකීර්ණය | 100.00 | 100.00 | 0.00 | - | 15% |
| 4 | 219-02-02-17-2104-46<br>බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩා සංකීර්ණය. | 60.00 | 60.00 | 0.13 | 0.21 | 75% |
| 5 | 219-02-2-32-2104<br>ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනය | 57.70 | 57.70 | 57.70 | 100 | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | 219-02-02-(2001, 2002, 2003, 2102, 2103)<br><br>මූලධන වත්කම් සංවර්ධන හා වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය/ මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 42.00 | 42.00 | 32.43 | 77.21 | 50% |
| 7 | 219- 02-2401<br><br>ධාරිතා සංවර්ධන වැඩසටහන | 1.00 | 1.00 | 0.18 | 18 | 25% |
| 8 | 219-01-01<br><br>අනෙකුත් | 20.00 | 20.00 | 3.20 | 16 | 25% |
| | **219 – 2 – 2 – 1409 -** **දක්ෂතා සංවර්ධන වැඩසටහන්** | | | | | |
| | 219- 02- 02 – 1508 – 24 ක්‍රීඩකයන්ට ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සඳහා පහසුකම් සැලසීම | 100.00 | 100.00 | 94.215 | 94.02 | 100% |
| | 219- 02- 02 – 1508 – 25 දෙවන ස්ථරයේ ක්‍රීඩක සංචිතය - ක්‍රීඩා ශක්ති | 100.00 | 100.00 | 68.797 | 68.79 | 90% |
| | 219- 02- 02 – 1508 – 26 ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලි | 345.00 | 365.00 | 346.95 | 95.12 | 100% |
| | 219- 02- 02 – 1508 – 27 ජාතික ක්‍රීඩා තරගාවලිය | 195.00 | 222.00 | 195.304 | 87.97 | 100% |
| | 219- 02- 02 – 1508 – 28 උසස් දක්ෂතා සහිත ක්‍රීඩක සංචිතය සඳහා පහසුකම් සැලසීම | 100.00 | 52.30 | 51.452 | 98.37 | 90% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 219- 02- 02 –1203 – 27<br>ජාතික සංචිත සඳහා පෝෂණය | 217.00 | 202.00 | 181.97 | 90% | % |

**08.**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය **2024.12.31** දිනට

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රු.මි.) | % |
| පුනරාවර්තන වියදම | 1,624.541 | 1,534.544 | 1486.045 | 79% |
| ප්‍රාග්ධන වියදම | 1,157.696 | 1,157.696 | 946.766 | 95% |
| එකතුව | **2,782.237** | **2,692.240** | **2,432.811** | **92%** |

**09. 2024 වර්ෂය තුල ලබාගත් විශේෂ ජයග්‍රහන**

- 2024 ප්‍රංශයේ පැරිස් හි පැවති පැරාලිම්පික් තරඟාවලියේ F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් සමිත දුලාන් විසින් රිදී පදක්කම දිනා ගැනීම.
- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශුරතා තරඟාවලියේ දී F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් **ලෝක වාර්තාවක් සමඟින් සමිත දුලාන් විසින් රන් පදක්කම** දිනා ගැනීම.
- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශුරතා තරඟාවලියේ දී මීටර් 100 ඉසව්වෙන් එම්.ජී.නුවන් ඉන්දික විසින් ලෝකඩ පදක්කම දිනා ගැනීම.
- ජපානයේ කෝබේ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලියේ දී යගුලිය විසිකිරීමේ ඉසව්වෙන් පාලිත බණ්ඩාර විසින් ලෝකඩ පදක්කම දිනා ගැනීම.
- ජෝර්දානයේ පැවති පැරාලිම්පික් ටේබල් ටෙනිස් තරඟාවලියේ දී පී.ඩී.එස්.දිනේෂ් ප්‍රියන්ත විසින් රන් පදක්කම දිනා ගැනීම.
- මොරොක්කෝවේ පැවති 2024 ග්‍රෑන්ඩ් ෆික්ස් ලෝක පැරා මලල ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් 02 ක් හා රිදී පදක්කම් 05 ක් දිනා ගැනීම.
- ඩුබායි හි පැවති ග්‍රෑන්ඩ් ෆික්ස් පැරාලිම්පික් මලල ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් 02 ක් රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- 21 වන ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02 ක් පදක්කමක් දිනා ගැනීම.
- එක්සත් අරාබි එමීර් හි පැවති කණිෂ්ඨ ග්‍රෑන්ඩ් ෆික්ස් මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- 2024 ජපානයේ ඔසාකා හි පැවති මලල ක්‍රීඩා තරඟාවලියේ දී එච්.කේ.කාලිංග කුමාරගේ විසින් රන් පදක්කමක් හා ජපානයේ ටෝකියෝ හි පැවති මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කමක් දිනා ගැනීම.
- පළමු ආසියානු සහය දිවීමේ ශුරතාවලියේ දී පිරිමි සහය දිවීමේ කණ්ඩායම විසින් රන් පදක්කම හා කාන්තා සහය දිවීමේ කණ්ඩායම විසින් රිදී පදක්කම දිනා ගැනීම.
- තායිවානයේ පැවති විවෘත මලල ක්‍රීඩා තරඟාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා තරුශි කරුණාරත්න විසින් මීටර් 400 හා මීටර් 800 ඉසව්වෙන් රන් පදක්කම් 2 ක් දිනා ගැනීම.

- චීනයේ මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් දිනා ගැනීම.
- 19 වන ස්පාඤ්ඤ ජාත්‍යන්තර මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා කාලිංග කුමාරගේ විසින් රිදී පදක්කමක් දිනා ගැනීම.
- කොරියාවේ පැවති 2 වන ආසියානු හෙල්ල විසි කිරීමේ තරඟාවලියේ දී රන් පදක්කමක් හා ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීම.
- බහමාස් හි පැවති මළල ක්‍රීඩා ශූරතාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් දිනා ගැනීම.
- මාලදිවයිනේ පැවති 6 වන ආසියානු තරඟාවලියේ දී කාන්තා කණ්ඩායම විසින් රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02ක් දිනා ගැනීම.
- ඉරානයේ පැවති 32 වන ෆාජ් ජාත්‍යන්තර තරඟාවලියේ දී බැඩ්මින්ටන් ක්‍රීඩක හසිත අනුරුද්ධ විසින් හා විරේන් නෙත්තසිංහ විසින් ලෝකඩ පදක්කම් 02ක් දිනා ගැනීම.
- IFBB ආසියානු කායවර්ධන ශූරතා තරඟාවලියේ දී රිදී පදක්කම් 03 ක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම විසින් 2024 ආසියානු ශූරතාවය දිනා ගැනීම.
- ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම විසින් නවසීලන්තය සමඟ පැවති ටෙස්ට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීම
- තායිලන්තයේ පැවති U 15 & U 20 මල්ලවපොර තරඟාවලියේ දී නෙත්මි අහිංසා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- 20 න් පහළ කාන්තා වොලිබෝල් කණ්ඩායම විසින් අනුශූරතාවය දිනා ගැනීම.
- තායිලන්තයේ පැවති ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලියේ දී චාමර නුවන් ධර්මවර්ධන විසින් රන් පදක්කමක් දිනා ගැනීම.
- තායිලන්තයේ පැවති ජාත්‍යන්තර ජූඩෝ තරඟාවලියේ දී ශ්‍රී ලංකා කණ්ඩායම විසින් රිදී පදක්කම් 04 ක් හා ලෝකඩ පදක්කම් 04 ක් දිනා ගැනීම.
- ෆීජී හි පැවති 2024 පොදු රාජ්‍ය මණ්ඩලීය (කණිෂ්ඨ,ජ්‍යෙෂ්ඨ,තරුණ) තරඟාවලියේ දී කේ.ඒ.අශේන් සචින්ත විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- ලෝක කැරම් තරඟාවලිය සඳහා සහභාගී වූ කණ්ඩායම විසින් කාන්තා හා පිරිමි ඒකල කණ්ඩායම් විසින් රිදී පදක්කම් 02 ක් හා කාන්තා හා පිරිමි යුගල කණ්ඩායම් විසින් ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීම.
- ශ්‍රී ලංකා කණ්ඩායම විසින් ආසියානු නෙට්බෝල් අනුශූරතාවය දිනා ගැනීම.
- තායිලන්ත ASBC බොක්ෂිං ආසියානු එලයිට් පිරිමි ශූරතා තරඟාවලියේදී පසිඳු උමයංග මිහිරාජ් ක්‍රීඩකයා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- බොට්ස්වානා හි පැවති ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරඟාවලියේදී ජයග්‍රහණ ලබා ගැනීම
- බංගලාදේශයේ පැවති Yonex Sunrise International Challenges 2024 තරඟාවලියේදී බැඩ්මින්ටන් ක්‍රීඩක විරේන් වෙත්තසිංහ විසින් රන් පදක්කමක් හා බැඩ්මින්ටන් ක්‍රීඩිකාවන් වන ඉසුරි අත්තනායක හා සිතුමි සිල්වා විසින් ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.




2024 ශ්‍රී ලංකා පැරාලිම්පික් කණ්ඩායම




2024 ශ්‍රීලංකා ඔලිම්පික් කණ්ඩායම




නුවන් ඉන්දික




තරුෂි කරුණාරත්න




අරුණ දර්ශන




චාමර නුවන් ධර්මවර්ධන




ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට්



එච්.ජී.පාලිත බණ්ඩාර



නෙත්මි අහිංසා




පිරිමි සහය දිවීමේ




ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම
නවසීලන්ත තරඟ ජයග්‍රහනය



සමිත දුලාන්

## 10.2024.12.31 දිනට ළඟා කරගත් ඉලක්ක

- තායිලන්තයේ පැවති U19 හා U20 ආසියානු මල්ලවපොර ශූරතාවලිය සඳහා සහභාගී වූ නෙත්මි අහිංසා ක්‍රීඩිකාව විසින් මල්ලවපොර ක්‍රීඩාව වෙනුවෙන් ලෝකඩ පදක්කමක් දිනාගත් අතර එය මල්ලවපොර ක්‍රීඩාව වෙනුවෙන් දිනාගත් ප්‍රථම ආසියානු මට්ටමේ පදක්කමකි.
- අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුක්තව මාතලේ හා ටොරින්ටන් හොකී ක්‍රීඩාංගන දෙකෙහි වැඩ අවසන් කිරීම
- 2024 වෙනුවෙන් අපේක්ෂිත ජාත්‍යන්තර පදක්කම් සංඛ්‍යාව අභිබවායමින් මේ වන විට ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් රන් පදක්කම් 15 ක් රිදී පදක්කම් 26 ක් හා ලෝකඩ පදක්කම් 19 ක් දිනා ගැනීම.

## 11.ඉදිරි ඉලක්ක 2025-2028

- 2027 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුල සුදුසුකම් සහිත වැඩිම ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණයකගේ සහභාගීත්වයෙන් දකුණු ආසියානු ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේදී පැවැත්වීම සම්බන්ධයෙන් සැලසුම් කිරීම
- ජාතික සම්මේලන හා සංගම්වල සහයෝගීත්වයෙන් 2025 වර්ෂයේදී ජාත්‍යන්තර තරඟාවලීන් 10 ක් පමණ මෙරටදී පැවැත්වීම.
- ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන කායවර්ධන මධ්‍යස්ථාන ප්‍රමිතිගත කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමට වැඩපිළිවෙලක් ආරම්භ කිරීම.

# ජාතික තරුණ සේවා සභාව

# 2024

## ප්‍රගති වාර්තාව

**ජාතික තරුණ සේවා සභාව**

## 01.හැඳින්වීම

ජාතික තරුණ සේවා සභාව, 1979 අංක 69 දරණ පාර්ලිමේන්තු පනත ප්‍රකාරව පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා කැප වූ ප්‍රධානතම රාජ්‍ය ආයතනය ජාතික තරුණ සේවා සභාව බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. මෙරට තරුණ සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා ආරම්භයේ සිට මේ දක්වා මෙම ආයතනය ඉතා සක්‍රිය දායකත්වයක් ලබා දෙමින් සිටී.මෙහි ප්‍රධාන මූලස්ථානය මහරගම පිහිටා ඇති අතර, තරුණ තරුණියන්ට වඩාත් සමීපව සේවා සැපයීම වස් පළාත් මට්ටමින් කාර්යාල 09ක්, දිස්ත්‍රික් කාර්යාල 26ක් හා වෘත්තීය පුහුණු පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල මධ්‍යස්ථාන 59 ක් ද දිවයින පුරා පිහිටුවා ඇත.

විශේෂයෙන්, කාලීනව සිදුවන වන සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික (කලාව), ක්‍රීඩා හා තාක්ෂණික ක්ෂේත්‍රයන් හී නව ප්‍රවනතා සැළකිල්ලට ගනිමින් එයට අදාළ වූ තරුණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එහිදී, සහස්‍ර සංවර්ධන හා ප්‍රමිතිගත ඉලක්ක, තිරසර සංවර්ධන අරමුණු (SDG Goals) සාක්ෂාත් වන අයුරින් ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.කෙසේ වෙතත්, ඉදිරි වකවානුව තුළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" තේමාන්විත රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයයේ ඉලක්ක සම්පූර්ණ කිරීම හා ඒ වෙනුවෙන් "තෘප්තිමත් තාරුණ්‍යයක් - නිවහල් චින්තනයක්" ශ්‍රී ලාංකික තරුණයාට උරුම කරදීම සඳහා කටයුතු කරමින් සිටී. ඒ වෙනුවෙන් තරුණ සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන්,සේවාවන්,ආයතනික පරිශ්‍රය මෙන්ම සේවා සපයන්නන්ගේ (නිලධාරීන්) දැනුම,ආකල්ප,කුසලතා ද නව්‍යකරණය කරනු ලබයි.

මෙම කර්තව්‍යයන් යථාවත් කිරීම උදෙසා තරුණ තරුණියන් නවීන කෘෂි කර්මාන්තයට යොමු කිරීම, නව වෙළඳපොළ ආකර්ශනය කල හැකි ව්‍යවසායකයන් බවට තරුණයන් පත් කිරීම වෙනුවෙන් පුහුණු පාඨමාලා/වැඩමුළු පැවැත්වීම, තරුණයන්ගේ විභව ශක්තීන් ඉස්මතු කර, කුසලතා පරිපූර්ණත්වයට පත් කිරීම සඳහා ක්‍රීඩා හා සෞන්දර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නව තාක්ෂණික දැනුම සහිත වෘත්තීය පුහුණු ලබා දීම, තරුණ තරුණියන්ගේ මෙන්ම නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය කිරිම සඳහා පුහුණු වැඩසටහන් දියත් කිරීම, මෙරට තරුණයාට අන්තර්ජාතික අත්දැකීම් ලබාදීම වෙනුවෙන් අන්තර්ජාතික වැඩසටහන්,වැඩමුළු වලට තරුණයන් මෙන්ම ජාත්‍යන්තර අත්දැකීම් හුවමාරු කරවීම වෙනුවෙන් නිලධාරීන්ට සහභාගිවීමට අවස්ථාව සළසාදීම, තරුණයාගේ දේශපාලනික අවබෝධය පුළුල් කිරීම උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, තරුණයාගේ අන්තර් සබඳතා ශක්තිමත් කිරීම සඳහා අවස්ථා සැපයීම හා ඒ වෙනුවෙන් දිවයින පුරා පිහිටි යෞවන සමාජ ජාලගත කිරීම, ස්වෙච්ඡා සමාජ ක්‍රියාකාරකම් සඳහා අනුබල දීම, අන්තර් පුද්ගල, අන්තර් ආයතන සම්බන්ධීකරණයන් ගොඩනැංවීම, වෘත්තීය ලැදියාව මත පුහුණු පාඨමාලා සහ රැකියා අවස්ථා තෝරා ගැනීමට අවශ්‍යය වෘත්තීය මාර්ගෝපදේශ ලබාදීම, තරුණයා විෂයෙහි පවතින විවිධ මානසික හා සමාජීය ගැටළු නිරාකරණය සඳහා අවශ්‍යය මඟපෙන්වීම හා උපදේශනය සැපයීම ආදිය සිදු කෙරේ. ඒ අනුව, තරුණයා ආර්ථික,සමාජීය,සංස්කෘතික,කායික හා මානසික වශයෙන් බලසතුකරණය කිරීම සඳහා වැඩසටහන් රාශියක් 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කරමින් සිටී.

ඒ අනුව 2024.ජනවාරි 01 දින සිට නොවැම්බර් 30 දක්වා සිදුකල ක්‍රියාකාරකම් වල සාරාංශය මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ.

**02.දැක්ම:-**

බලසතු වූ ශ්‍රී ලාංකිය තරුණයෙක්

**03.මෙහෙවර:-**

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොට ගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකේය තරුණයා සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

**04.අරමුණු:-**

1. ජාතික හැගීම පිළිබඳ උද්යෝගයක්, විනය පිළිබඳ හැගීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැගීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.
2. ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.
3. ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යොන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
4. තරුණයන් අතර තරගකාරිත්වය හා ජයග්‍රහණය පිළිබඳ හැගීම් සඳහා දිරි ගැන්වීම.
5. තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණු වීම ලබා දීම.
6. තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම.
7. තරුණයන් අතර ශාරීරික ප්‍රාගුණය හා ක්‍රීඩා සංවර්ධනය සඳහා දිරි ගැන්වීම.
8. තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම.
9. ආබාධිත තරුණයන්ට සහය වීම.
10. රාජ්‍යයේ ආර්ථික සැලසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථා සැලසීම.
11. ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරිමේදී තරුණයින්ගේ සහභාගිත්වය සඳහා අවස්ථාව සැලසීම.
12. තරුණ සංවිධානය පිහිටුවීම සහ තරුණ සුබ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධානවලට සහය වීම.
13. තරුණ සේවා ව්‍යාප්තිය සැලසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.
14. එක් එක් තරුණයාගේ ආවේණික ලක්ෂණ වර්ධනය කිරීම.

## 05.ප්‍රධාන කාර්යයන්:-

### 5.1 තරුණ සංවර්ධනය

**a. 1. තාරුණ්‍යය ජාලගත කිරීම සහ අනාගතයට ගැළපෙන තරුණ පරපුරක් නිර්මාණය කිරීම හා තරුණ නායකත්ව සංවර්ධනය**

- තරුණ තරුණියන් සංවිධානගත කිරීම හා ඔවුන්ගේ නායකත්ව කුසලතා බලගැන්වීම.
- තරුණ තරුණියන්ගේ ක්‍රීඩා, සංස්කෘතික, මාධ්‍ය, සිනමා හා ආර්ථික නිපුණතා සංවර්ධනය කිරීම
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට ජාත්‍යන්තර පිළිගැනීම ඇති කිරීම.
- තරුණ සංවර්ධනය ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- දේශීය හා විදේශීය තරුණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීමට කටයුතු කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති අයගේ කුසලතා හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම තුළින් ඔවුන්ට සමාජගතවීම සඳහා අවස්ථා ලබා දීම
- ප්‍රජා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම , ආකල්ප හා කුසලතා සංවර්ධනය කර ගැනීමට ප්‍රායෝගිකව අවස්ථාව ලබා දීම.
- තරුණයාගේ මනෝ සමාජීය සංවර්ධනය කිරීම.
- විවිධ සමාජ වැඩ පරිචය මඟින් සැබෑ ක්‍රියාකාරකයෙකු , සහ ස්වේච්ඡා නායකයෙකු ලෙස ගොඩනැංවීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම

### 5. 2 තරුණයින් තුළ වෘත්තීය සහ රැකියා නිපුණතා සංවර්ධනය

- දේශීය හා විදේශීය රැකියා ඉලක්ක කරගත් පාඨමාලා ක්‍රියාත්මක කිරීම
- තරුණ තරුණියන් හට වෘත්තීය මාර්ගෝපදේශනයන් ලබා දීම හා තරුණ මානසික සංවර්ධනය උදෙසා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හා විදේශ රැකියා අවස්ථා ජනිත වන පරිදි පාඨමාලා සංවර්ධනය කිරීම
- පාඨමාලා අවසානයේ විභාග හා ඇගයීම් පවත්වා සහතික පිරිනැමීම හා රැකියා පුහුණු අවස්ථා සඳහා යොමු කිරීම

### 5. 3 තරුණ ව්‍යාපාර සංවර්ධනය

- නවීන තාක්ෂණය ඒකාබද්ධ කිරීම, නිෂ්පාදන සංවර්ධනය සහ අලෙවිකරණය
- ශ්‍රී ලංකා තරුණ ගොවිපළ සංවර්ධනය
- බිම්මල් හා සත්ත්ව නිෂ්පාදන වැඩසටහන
- සංචාරක කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම
- කෘෂි සංවර්ධන පාඨමාලා ක්‍රියාත්මකකිරීම

### 5.4 ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලාංකික තරුණයින් සවිබලගැන්වීම

- ජාත්‍යන්තර තරුණ සම්මන්ත්‍රණ, සමුළු, සංස්කෘතික වැඩසටහන් සහ වැඩමුළු සඳහා ශ්‍රී ලාංකීය තරුණයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා දීම.
- ගෝලීය තරුණ නායකයන් පුහුණු කිරීම
- ගෝලීය වශයෙන් තරුණ තරුණියන් අතර අත්දැකීම් හා දැනුම බෙදා ගැනීමට අවස්ථාව ලබාදීම
- තරුණයාගේ කුසලතා, දැනුම සහ ආකල්ප, ජාත්‍යන්තරයට රැගෙන යාමට අවස්ථාව ලබාදීම

## 5.5 ආයතනික සංවර්ධනය

### 5.5.1 අභ්‍යන්තර ධාරිතා සංවර්ධනය

- කාර්ය මණ්ඩල කුසලතා සංවර්ධනය සඳහා පුහුණු අවස්ථා ලබා දීම.
- නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා වැඩසටහන් දියත් කිරීම.
- තරුණ අපේක්ෂා ඉටු කිරීමට පහසුවන පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීම.
- ආයතනික දැක්මට අනුව උපායමාර්ග සැළසුම් කිරීම.

### 5.5.2 තොරතුරු තාක්ෂණ සංවර්ධනය සහ ප්‍රවර්ධනය

- නවින තාක්ෂණයෙන් පිරිපුන් හා බලගැන්වූ ආයතනික පසුබිමක් නිර්මාණය කිරිම
- පවතින භෞතික සම්පත් උපයෝජනය ඉහළ නංවා ආදායම් ඉපයීම.

### 5.5.3 යටිතල පහසුකම් සංවර්ධනය

### 5.5.4. ප්‍රාග්ධන වත්කම් සැපයීම, ඉදිකිරීම්, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම

- ආයතනයේ කාර්ය මණ්ඩලයේ යහ පැවැත්ම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නවීකරණය හා සංවර්ධනය කිරීම

## 06.මානව සම්පත් පැතිකඩ : 2024.12.31 වන දිනට

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 74 | 49 | 25 | - |
| තෘතියික | 129 | 63 | 66 | - |
| ද්විතියික | 1138 | 903 | 235 | - |
| ප්‍රාථමික | 285 | 206 | 79 | - |
| **එකතුව** | **1626** | **1221** | **405** | **-** |

## 07. ළඟා කරගත් ඉලක්ක - 2024.12.31 දිනට

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|---|
| 01. | තරුණ සෞන්දර්ය කුසලතා සංවර්ධන වැඩසටහන් | 13 | 6,707 |
| 02. | ක්‍රීඩා කුසලතා සංවර්ධන වැඩසටහන්<br>• හෙයියන්තුඩුව (වොලිබෝල් හා කබඩි සංචිත)<br>• පාපැදි තරගය<br>ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ කට්ටල (212) | 05 | 35<br>23<br>1300 |
| 03. | තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන්<br>• යෞවන සමාජ පිහිටුවීම (ග්‍රාමීය,ප්‍රාදේශීය,දිස්ත්‍රික්) | 11,732 | 281,687 |
| 04. | විභාග ඇගයීම්<br>• සහතිකපත් නිකුත්කිරීම - 11,561 | 02 | 11,561 |

| | | | |
|---|---|---|---|
| | • නිපුණතා පාදක ඇගයීම් - 380<br>(පුහුණුලාභීන් - 8,813) | | |
| 05. | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහන්<br>• වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් - 486<br>• උපදේශන සේවා වැඩසටහන් - 116<br>• ගීත රසවින්දන වැඩසටහන් - 05 | 607 | 45,679 |
| 06. | තරුණ ගොවිපළ සංවර්ධනය<br>• ගොවිපළ මධ්‍යස්ථාන<br>කෘෂි ක්ෂේත්‍ර සහයක පාඨමාලාව<br>පැල තවාන් සංවර්ධනය සහයක<br>සුහුරු කෘෂි කර්මාන්තය පාඨමාලාව | 03 | 222 |
| 07. | සැළසුම් හා ප්‍රගති සමාලෝචන වැඩසටහන් | 03 | - |
| 08. | මානව සම්පත් ධාරිතා සංවර්ධනය වැඩසටහන් | 11 | 946 |
| 09. | තොරතුරු තාක්ෂණ වැඩසටහන් ( තොරතුරු තාක්ෂණය උපයෝගි කර ගනිමින් ආයතනික ධාරිතාවය සංවර්ධනය කිරිම | 03 | - |
| 10. | සමාජ අලෙවිකරණය සහ ප්‍රවර්ධන වැඩසටහන් (විවිධ මාධ්‍ය යටතේ තරුණ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය)<br>• මාධ්‍ය ප්‍රචරණ වැඩසටහන් - 305<br>• ප්‍රචාරණ දැන්වීම් - 220<br>• තේමා ගීතය 01 | 526 | - |
| 11. | ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා වැඩසටහන් | 24 | 3,657 |
| 12. | ජාත්‍යන්තර තිළිණ වැඩසටහන් | 33 | 1,403 |
| 13. | තරුණ පාර්ලිමේන්තුව හා සමගාමී වැඩසටහන්<br>• සැසිවාර - 01<br>• විෂය නිර්දේශ සැකසීම - 01 | 02 | 190 |
| 14. | රැකියා අභිමුඛ පුහුණු පාඨමාලා | 61 | 19,864 |

**08 . සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මි) | 2024.12.31 ට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % | සමුච්චිත භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 01 | තරුණ සංවර්ධන වැඩසටහන් 194-02-07-02-2201 | | | | |
| | i.භාණ්ඩාගාර ප්‍රතිපාදන | 1,450.00 | 426.089 | 34.52% | 65% |
| | ii. ජනාධිපති ලේකම් කාර්යාලයීය ප්‍රතිපාදන | 739.87 | 278.82 | 37.68% | 68% |
| **එකතුව** | | **2,189.87** | **704.909** | | |

**09. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2024.12.31 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රු.මි.) | % |
| • පුනරාවර්තන වියදම | 1565 | 1333 | 85.28% |
| • ප්‍රාග්ධන වියදම | (භාණ්ඩාගාර) 1450.00 | 715 | 49.30% |
| | 739.87 (ජනාධිපති ලේකම් කාර්යාලයීය ප්‍රතිපාදන) | 278.82 | 37.68% |

## 10. ඉදිරි ඉලක්ක 2024-2027

**පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය සාක්ශාත්කර ගැනීම සඳහා "තෘප්තිමත් තාරුණ්‍යයක් - නිවහල් චින්තනයක්" නිර්මාණය කිරීම වෙනුවෙන්,**

මෙරට තරුණ ප්‍රජාව ආර්ථික ක්‍රියාවලියේ සක්‍රීය පංගුකරුවන් කිරීම, පීඩනයෙන් සුරාකෑම සහ වෙනස් කොට සැළකීම් වලින් තරුණ ප්‍රජාව ආරක්ෂා කර ගැනීම, තරුණයාගේ සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් දායකත්වය සැපයීම, තරුණයා විද්‍යාව හා තාක්ෂණ අංශයන් හී කොටස්කරුවන් කිරීම, සමාජ අභියෝග ජයගැනීම වෙනුවෙන් පුද්ගල පෞරුෂය සංවර්ධනය කිරීම, දේශපාලන - සමාජ - ආර්ථික ක්‍රියාවලියට - නායකත්වය ගොඩනැගීමට අවශ්‍යය පහසුකම් හා මාර්ගෝපදේශ සැපයීම, සංස්කෘතික ජීවිතය හා නිදහස් චින්තනයට ඉඩහසර ලබා දීම, ජාතික හා ජාත්‍යන්තරයට නායකත්වය සැපයිය හැකි වන පරිදි සුහුරු කුසලතා සංවර්ධනය කිරීම, සමාජ අසාධාරණය පිටු දකින සමාජයක් නිර්මාණය කිරීම සඳහා තරුණ පෞරුෂය ගොඩ නැගීම යන ප්‍රධාන මූලධර්ම පාදක කරගත් රජයේ තරුණ ප්‍රතිපත්තිය යථාවත් කිරීම සඳහා ජාතික තරුණ සේවා සභාවේ තරුණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් නව්‍යකරණයට ලක් කෙරේ.

- තරුණ සංවිධාන පිහිටුවීම හා ස්වේච්ඡා සේවය දිරි ගැන්වීම
- තරුණයාගේ කායික හා මානසික යහපැවැත්ම ඇතිකිරීම,
- විෂ මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතයෙන් තරුණයා ආරක්ෂා කර ගැනීම,
- තරුණයා වෙනුවෙන් ලිංගික අධ්‍යාපනය ලබාදීම,
- සයිබර් අවකාශය තොරතුරු තාක්ෂණය නායකත්ව කුසලතාවය,
- පරිසර සංවේදීභාවය, ස්ත්‍රී - පුරුෂ සමාජීයභාවය,
- අධ්‍යාපනය හා තාක්ෂණ, නවෝත්පාදනය, කලා - සංස්කෘතික රසවින්දනය හා විනෝදාස්වාදය ලබාදීම, වෘත්තිය නිපුණතාවය ඇතිකිරීම
- දේශීය හා විදේශීය වෙළෙඳපොළ සඳහා අවශ්‍ය පරිදි පාඨමාලා වෙනස් කිරීම
- පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- විදේශ රැකියා අවස්ථා මත ජාත්‍යන්තර භාෂා පාඨමාලා වැඩි කිරීම.
- දැනුම හා පහසුකම් ලබාදී තරුණ ව්‍යවසායකයින් බිහි කිරීම.
- කෘෂිකාර්මික ආර්ථිකයකට සහ කෘෂි ව්‍යවසායකත්වයකට තරුණයන් යොමු කිරීම
- දේශීය හා විදේශීය තරුණ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියට තරුණ සහභාගීත්වය සඳහා අවස්ථා ලබා දීම
- ආයතනය තුළ ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා ඉදිරි වැඩකටයුතු සිදු කිරීම.

# ජාතික යෞවුන් සේනාංකය

# 2024

## ප්‍රගති වාර්තාව

## ජාතික යොවුන් සේනාංකය

### 01.හැඳින්වීම

අනාගත ශ්‍රමිකයා විනය, නායකත්වය, පෞරුෂ සංවර්ධනය යන හර පද්ධතීන් මත තරුණ සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීය අධ්‍යාපනය මඟින් බලගන්වමින් රටේ ආර්ථික සංවර්ධනය ඇතිකරලීම සඳහා දායකකරලීමට යොවුන් සේනාංකය පැහැදිලි වූත්, විධිමත් වූත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරයි. ඒ සඳහා ජීවන කුසලතා සංවර්ධනය මූලික ක්‍රමෝපාය කරගත් සංවිධිත පුහුණු පාඨමාලාවන් රසක් ක්‍රියාවට නංවා ඇත.

2002 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත මඟින් පිහිටු වන ලද යොවුන් සේනාංකය වර්තමානය වන විට දිවයින පුරා ව්‍යාප්ත වී ඇති පුහුණු මධ්‍යස්ථාන 58 කින් යුත් පුළුල් ජාලයකින් සමන්විත වේ.

ජීවන කුසලතා පාඨමාලාව ඊට ආවේණික සුවිශේෂී විෂය පථයකින් සහ වැඩසටහන් රාශියකින් ද ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ විෂය ධාරාවන්ගෙන් ද යුක්තය. ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් තුළ ජීවන කුසලතා සංවර්ධනය කිරීමේ විශේෂ පුහුණු වැඩසටහනක අවශ්‍යතාවය වර්තමානය වන විට ඉතා බැරෑරුම් ලෙස පෙනී ගොස් ඇති පසුබිමක ජීවන කුසලතා සංවර්ධනය කරනු ලබන ප්‍රමුඛතම හා එකම ශ්‍රී ලාංකේය රාජ්‍ය ආයතනය වශයෙන් යොවුන් සේනාංකය ජීවන කුසලතා සංවර්ධනය උදෙසා කැපවී ක්‍රියා කරමින් සිටී.

එමෙන්ම දඹුල්ල ඉනාමළුව ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති හෝටල් පුහුණු පාසල මඟින් වාර්ෂිකව තරුණ තරුණියන් රසකට ජාතික සහ ජාත්‍යන්තර තලයේ රැකියා අවස්ථා සඳහා ප්‍රවේශ විය හැකි සහතික පත්‍රයක් සමඟ ජාතික වෘත්තීය සුදුසුකම(NVQ) සහිතව සංචාරක හෝටල් ක්ෂේත්‍රයේ මෙරට පිළිගත් රැකියා සඳහා අවස්ථාව හිමිකරදෙනු ලැබේ. තවත් විශේෂිත පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සැලකෙන නාවුල බැහැරගත පුහුණු මධ්‍යස්ථානය පුද්ගල නායකත්වය, පෞරුෂ සංවර්ධනය හා අභියෝගවලට නොසැලී මුහුණ දීමේ ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන අතර මෙම විශේෂ පුහුණු මධ්‍යස්ථාන ද්විත්වයම යොවුන් සේනාංකය ආදායම් උත්පාදන වැඩපිළිවෙළකට ප්‍රවේශ කරන හැරවුම් ලක්ෂයන් ලෙස සැලකිය හැක. එසේම වැඩිදියුණු කරමින් පවතින කතරගම යෝජිත හෝටල් පුහුණු පාසල දක්ෂිණ ලංකාවේ තරුණ ප්‍රජාව සඳහා අනාගත හෝටල් ක්ෂේත්‍රයේ මංපෙත් විවර කරන මධ්‍යස්ථානයක් ලෙස ද හඳුන්වා දිය හැක.

එමෙන්ම දිවුලපිටිය යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය විශේෂ ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කර තිබේ. දැනටමත් යක්කල, යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය තුළ සෞන්දර්ය පාඨමාලා ආරම්භ කොට කලා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් උනන්දුවක් සහිත තරුණ තරුණියන් සඳහා ගායනය, බෙරවාදනය හා නර්තනය පිළිබඳ පාඨමාලා මෙහෙයවමින් සිටී. මෙම සියලු පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම(NVQ) සහිතව තරුණයන් වෙත ප්‍රදානය කරන පාඨමාලා වීම ද විශේෂත්වයකි.

යොවුන් සේනාංකය මඟින් මෙහෙයවනු ලබන පාඨමාලා සහ වැඩසටහන් පහත සඳහන් පරිදි හඳුනාගත හැකිය.

| අනු අංකය | පුහුණු වැඩසටහන් | වෙනත් |
|---|---|---|
| අ. | ජීවන කුසලතා පුහුණු පාඨමාලාව | මෙම පාඨමාලාව සාර්ථකව නිම කරනු ලබන යොවුන් ශිෂ්‍යභට/භටවියන් සඳහා යොවුන් සේනාංක ජීවන කුසලතා සහතිකයට අමතරව, City & Guilds ආයතනය විසින් යොවුන් සේනාංක ජීවන කුසලතා පුහුණුව සඳහා පිරිනමනු ලබන ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සහතිකයක් ලබා ගැනීමට ද පුහුණුලාභීන්ට අවස්ථාව සලසා ඇත. |
| ආ. | ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණ පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියලත් ආයතනයක් සමඟ ඒකාබද්ධව මෙම පුහුණු වැඩසටහන මෙහෙයවනු ලබයි.<br>ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරි උසස් අධ්‍යාපන කටයුතු සඳහා මෙම පාඨමාලාව පාදක සුදුසුකමක් ලෙස ද සැලකේ. |
| ඇ. | වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම | ජීවන කුසලතා පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලබන යොවුන් ශිෂ්‍ය භටයින් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීමට කටයුතු කෙරේ.<br>විශේෂ ඇගයීම් ක්‍රමවේදයක් තුළින් එක් මධ්‍යස්ථානයකින් එක් කණ්ඩායමක් සඳහා යොවුන් ශිෂ්‍ය භටයින් 30 දෙනෙකු බැගින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි යොවුන් ශිෂ්‍ය භටයින් 1680 දෙනෙකුට වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීම සඳහා රු. 100,000/- ක උපරිමයකට යටත්ව පූර්ණ ශිෂ්‍යත්වයක් ද ලබාදෙනු ලැබේ. වාර්ෂිකව පිරිනැමීමට නියමිත ශිෂ්‍යත්ව සංඛ්‍යාව 3360 කි. |
| ඈ. | හෝටල් පුහුණු පාඨමාලාව - දඹුල්ල | වාර්ෂිකව කණ්ඩායම් 02 ක් පුහුණුව සඳහා බඳවාගනු ලබන අතර, හෝටල් ක්ෂේත්‍රයේ පහත පාඨමාලා මේ යටතේ ක්‍රියාත්මක වේ.<br>- පේස්ට්‍රි හා බේකරි - NVQ Level IV<br>- ජාත්‍යන්තර සූපවේදය - NVQ Level IV<br>- ආහාරපාන පිළිගැන්වීම - NVQ Level IV<br>- පිළිගැනීමේ අංශය - NVQ Level IV<br>- ගෘහ පාලනය - NVQ Level III<br>- සහකාර බංගලා භාරකරු - NVQ Level III |
| ඉ. | වෙනත් රැකියා අභිමුඛ කරගත් පුහුණු පාඨමාලා | දේශීය විදේශීය රැකියා වෙළෙඳපොළ ඉල්ලුම සලකා බලමින් පාඨමාලා තෝරාගෙන අවස්ථානුකූලව සංවිධානය කරනු ලබයි. මෙම වසර තුළ වෙල්ඩින්(4G) පාඨමාලාව සිනෙක් ආයතනය සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබීය. |
| ඊ. | ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි පාඨමාලාව | ශ්‍රී ලංකා තාක්ෂණික විශ්ව විද්‍යාලය(SLTC) සමඟ අනුබද්ධිතව පවත්වාගෙන යනු ලබන වසර 03 ක උපාධි පාඨමාලාවකි. මේ වනවිට තරුණ |

| | | |
|---|---|---|
| | | තරුණියන් 400 දෙනෙකු පාඨමාලාව හදාරනු ලබයි. |
| උ. | විදේශ භාෂා පුහුණුව | චීන (HSK Level - I) භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව<br>ජපන් (JLPT Level - V) භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව |
| ඌ. | නර්තනවේදී හා සංගීතවේදී පාඨමාලා | සංගීත (ගායනවේදී) - NVQ4<br>නර්තන හා බෙර වාදන - NVQ6<br>මෙම පුහුණු පාඨමාලා යක්කල පුහුණු මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වේ. |
| එ. | SWISS හෝටල් කලමනාකරණ පාඨමාලාව | ස්විස් රජය බවර් ආයතනය හා ජාතික යොවුන් සේනාංකය ඒකාබද්ධව මෙම පාඨමාලාව මෙහෙයවනු ලබයි. දැනට පුහුණු මධ්‍යස්ථාන 10 ක පාඨමාලාව ක්‍රියාත්මක වන අතර සහභාගී වී සිටින පුහුණු ලාභීන් සංඛ්‍යාව 646 කි. පාඨමාලා කාලය මාස 09ක් වන අතර ඉන් මාස 04ක් රැකියා පුහුණුව සඳහා වෙන් කර ඇත. |

**<u>අ. ජීවන කුසලතා නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩසටහන් (බාහිර ආයතන)</u>**

- පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා
- දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන තුළ වෘත්තීය පුහුණුව සඳහා යොමුවන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ජීවන කුසලතා පුහුණුව
- රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා ජීවන කුසලතා හා නායකත්ව පුහුණු වැඩසටහන්
- විදේශීය රැකියාභිමුඛ පාඨමාලාලාභීන් සඳහා වූ ජීවන කුසලතා සංවර්ධන වැඩසටහන
- ගුරුභවතුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්
- වෙනත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන කාර්යමණ්ඩල සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්



ආ. සමාජ සංවර්ධන වැඩසටහන්

යොවුන් සේනාංකය පුහුණුලාභීන්ගේ අත්දැකීම් පරාසය පුළුල් කිරීම හා ආකල්පමය සංවර්ධනය අරමුණු කරගෙන පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- Y- Green කෘෂි වගා වැඩසටහන - පුහුණු මධ්‍යස්ථාන මට්ටමින් සහ පුහුණුලාභීන්ගේ ගෙවතු ආශ්‍රිත වගා වැඩසටහනකි.
- 'සෙනෙහෙ පියස' නිවාස සංවර්ධන ව්‍යාපෘතිය - පුහුණුලාභීන් විසින් අත්දැකීම් පරාසය පුළුල් කර ගැනීම, ආකල්ප සංවර්ධනය හා ජාතික සේවය පිළිබඳ හැඟීම් උද්දීපනය සඳහා අඩු ආදායම්ලාභී පවුලක් වෙත නිවසක් ඉදිකරදීමේ වැඩසටහනකි.
- 'සුසුමට සවියක්' ආපදා සංවර්ධන වැඩසටහන - ස්වභාවික හෝ වෙනත් ආපදාවකදී ස්වෙච්ඡාවෙන් සංවිධානාත්මකව ඉදිරිපත් වී ආපදාවට ලක් වූවන්ට සහන සැලසීම සඳහා වූ වැඩසටහනකි.
- 'ජීවිතයට ජීවයක්' ලේ දන් දීමේ වැඩසටහන - රෝහල් ක්ෂේත්‍රයේ ඉල්ලුම පරිදි ප්‍රජා සහභාගිත්වය ද සහිතව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනකි.
- 'සත්ව මිතුරු' අසරණ සතුන්ට පිහිටවීමේ වැඩසටහන - මාර්ගයේ හෝ කඩපිළ යනාදී පොදු ස්ථානයන්හි අසරණව හා ගිලන්ව සිටින සතුන් සඳහා ආහාරපාන ආදිය ලබාදීම හා රැකබලා ගැනීම සඳහා වූ වැඩසටහනකි.
- සිප්සවිය - පළවන ශ්‍රේණියට ප්‍රවේශ වන දුප්පත් පාසල් සිසුන් සඳහා පාසලට ප්‍රවේශවීමට අවශ්‍ය කරන මූලික ඉගෙනුම් හා අත්‍යවශ්‍ය උපකරණ ලබාදෙන වැඩසටහනකි.





මෙම සමාජ සංවර්ධන වැඩසටහන් යොවුන් ශිෂ්‍යභටයින් තුළ යහපත් ආකල්ප සංවර්ධනය, ශ්‍රමාභිමානී හැඟීම් වර්ධනය, දේශාභිමානී හැඟීම් වර්ධනය, අත්දැකීම් පරාසය පුළුල් කිරීම, යහපත් සමාජ සම්බන්ධතාවයක් ගොඩනැගීම, මානව හා සමාජ සංවේදීත්වය ගොඩනැගීම යනාදී අරමුණු පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

ඇ. තරුණ සංවර්ධන වැඩසටහන්

ජීවන කුසලතා පුහුණු පාඨමාලාව තුල අන්තර්ගත මෙම වැඩසටහන් පාඨමාලාවේ විෂය සන්ධාරය තුල මොඩියුල 09ට අතිරේකව යොවුන් ශිෂ්‍යභටයින්ගේ ප්‍රායෝගික කුසලතා හා ආකල්පමය සංවර්ධනයක් සමඟ විනය, නායකත්වය, හා පෞරුෂ සංවර්ධනයට අවශ්‍ය ස්වයං මඟ පෙන්වීමකට දිරි ගන්වනු ලබයි.

- **ක්‍රීඩා තරඟාවලිය** - යොවුන් ශිෂ්‍යභටයින්ගේ සැඟවුණු ක්‍රීඩා කුසලතා ඔප්නංවා ගැනීමට හා සංවර්ධනය කර ගැනීමට මධ්‍යස්ථාන පළාත් හා ජාතික මට්ටමින් ක්‍රීඩා තරඟාවලි 03ක්

සංවිධානය කරනු ලබයි. මෙහිදි විශේෂයෙන් වොලිබෝල්, නෙට්බෝල්, දුනු විදීම, වායු රයිෆල් වෙඩි තැබීම කණ්ඩායම් ක්‍රීඩා සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

- **ජාතික සංහිඳියා තරුණ හුවමාරු වැඩසටහන** - ජාතීන් අතර මිත්‍රත්වය සුහදත්වය සහෝදරත්වය ගොඩනැගීම සඳහා වූ සංස්කෘතික හුවමාරු වැඩසටහනකි.
- **වාර්ෂික සංස්කෘතික හා ආගමික දින වැඩසටහන්** - සිංහල, දමිළ, මුස්ලිම් ජාතීන්ට ආවේණික සංස්කෘතික උත්සව හා ආගමික උත්සව දිනවල මධ්‍යස්ථාන මට්ටමින් එම උත්සව සංවිධානය කොට ජාතික හා ආගමික විවිධත්වය පිළිබඳ හා ඒවා අගය කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ලබයි.
- **ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධන දිනය** - යොවුන් ශිෂ්‍යභටයින් තුළ ඉදිරිපත් කිරීමේ කුසලතාවයන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව හා මඟ පෙන්වීම සිදු කරනු ලබයි.
- **කලා උළෙල** - යොවුන් ශිෂ්‍යභටයින්ගේ ගායන වාදන නර්තන හැකියාවන්ට අවස්ථාවක් ලබා දෙමින් දක්ෂතා කල එළි දැක්වීම සඳහා කලා උළෙල සංවිධානය කිරීම.
- **මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන** - මත් ද්‍රව්‍ය භාවිතයේ දුර්විපාක හා ප්‍රතික්ෂේප කිරීමේ කුසලතාවය ගොඩනැගීමත් මත් ද්‍රව්‍ය විරෝධී ආකල්ප ගොඩ නැගීමත් මෙම වැඩසටහනේ සිදු කෙරේ.
- **වෘත්තීය යතුර පරීක්ෂණය** - යොවුන් ශිෂ්‍යභටයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හැකියා හා රුචිකත්ව අනුව තමන්ට ගැළපෙන වෘත්තීය ක්ෂේත්‍රය තෝරා ගැනීමට මඟ පෙන්වනු ලබයි.
- **නව නිපැයුම් / සොයා ගැනීම්, දේශීය ආහාර උළෙල හා ප්‍රදර්ශනය** - යොවුන් ශිෂ්‍යභටයින් තුළ නව නිපැයුම් හා සොයා ගැනීම් සඳහා දිරි ගැන්වීමක් ඇති කිරීමටත් දේශීය ආහාර රටා හා ඒවා පිළියෙල කිරීම පිළිබඳ සුපසන් අදහසක් ගොඩනැගීමටත් මෙම වැඩසටහන තුළින් කටයුතු කරනු ලබයි.
- **ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම** - ජාත්‍යන්තර තරුණ දිනය පිළිබඳව හා තරුණයාගේ කාර්යයභාරය පිළිබඳව තේමාවට අදාලව අවබෝධයක් ලබා දීම.
- **ආපදා කලමනාකරණ වැඩසටහන්** - ජාතික ආපදා තත්ත්වයකදී සහය වීම සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය
- **විවාද, රචනා හා පුවත්පත් ලේඛනයට අදාල කුසලතා ඇගයීම** - අදාල ක්ෂේත්‍රයේ දක්ෂතා ඇති යොවුන් ශිෂ්‍යභටයින්ගේ දක්ෂතා ඇගයීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ.
- **මනෝවිද්‍යා උපදේශනය** - මානසික හා මනෝ සමාජීය ගැටළු සහිත තරුණයින් හඳුනා ගෙන ගැටළු නිරාකරණය සඳහා සහය විම.
- **ස්වේච්ඡා සේවයේ අගය ප්‍රවර්ධනය කිරිම** - සමාජ සංවර්ධන හා සමාජ සේවා කටයුතු සඳහා දිරිගැන්වීමක් ඇති කිරිම.
- **කර්මාන්ත ශාලා නිරීක්ෂණය** - වැඩ අචාරධර්ම, ව්‍යවසායක ආකල්ප යොවුන් ශිෂ්‍යභටයින් තුල සංවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.
- **Y – Art** වැඩසටහන - යොවුන් ශිෂ්‍යභටයින්ට සිතුවම්කරණය, මූර්ති කැටයම් ගොක්කලාව ආදී ක්ශේත්‍රයන්ගේ පුහුණුවක් ලබා දී, ඔවුන්ගේ සැඟවුණු දක්ෂතා හඳුනා ගැනීමට අවස්ථාවක් ලබා දීම.





**02.දැක්ම**

"ගෝලීය සමාජයට ගැළපෙන, අභිමානවත්,සමබර ශ්‍රී ලාංකීය තාරුණ්‍යයක් "

**03.මෙහෙවර**

"නව්‍ය සංස්කෘතියක් උදෙසා සමාජ සංවර්ධනයට දායක වෙමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමුකතම සේවා සම්පාදන ආයතනය ලෙස ජීවන නිපුණතා ප්‍රශස්තව හා තිරසරව අත්කර දෙමින් ඉලක්ක ප්‍රජාව බලගන්වමින් ජාතික සංවර්ධනයට දයක වීම."

**04.අරමුණු**

- යෞවන/යෞවනියන්ගේ ජීවන කුසලතා සහ පෞරුෂත්ව සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය ලබාදීම, වෘත්තීය පුහුණුව සහ රැකියා අවස්ථාවන්ට යොමු කිරීම

**05.ප්‍රධාන කාර්යයන්**

**අ. මානව සම්පත් සංවර්ධන**

- යොවුන් සේනාංක පාඨමාලාව සඳහා යොවුන් ශිෂ්‍යභටයින්/භටවියන් බඳවාගැනීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා බඳවාගැනීම.
- පාඨමාලාව නිසි පරිදි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- බාහිර පාර්ශවයන් සඳහා ජීවන කුසලතා පුහුණුව ලබාදීම.
- යෞවන/යෞවනියන්ගේ සෞඳර්යත්මක හා ක්‍රීඩා කෞශල්‍යයන් වැඩි දියුණු කිරීමට දායකත්වයක් සැපයීම.
- ජීවන කුසලතා පාඨමාලාව අවසන් කරන යොවුන් ශිෂ්‍යභටයින් වෘත්තිය අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම සඳහා වෘත්තිය පුහුණු ආයතන සම්බන්ධීකරණය.
- ජීවන කුසලතා පාඨමාලාව හා ඉංග්‍රීසි, පරිගණක පාඨමාලාවන්හි ගුණාත්මක මට්ටම ඉහළ නැංවීම සඳහා සුදුසු ආයතනයක් සමඟ අනුබද්ධිත වීම.
- යොවුන් ශිෂ්‍යභටයින් විදේශ රැකියා සඳහා යොමු කිරීමට භාෂා හැකියාවන්(චීන, ජපන්, කොරියන්) ලබාදීම හා දේශීය විදේශීය රැකියා ඉලක්ක කරගත් වෘත්තිය පුහුණුව.

**යටිතල පහසුකම් සංවර්ධනය**

අ. ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු කාර්යයන්
ආ. මධ්‍යස්ථානයන්හි පුහුණු ධාරිතාවය ඉහළ නැංවීම සහ ඵලදායී වෘත්තිය පුහුණුව සඳහා සුදුසු පරිදි ගොඩනැගිලි නැවත සංවිධානය කිරීම.

**06.මානව සම්පත් පැතිකඩ**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 18 | 14 | 04 | - |
| තෘතියික | 127 | 77 | 50 | - |
| ද්විතියික | 716 | 512 | 204 | - |
| ප්‍රාථමික | 89 | 72 | 17 | - |
| **එකතුව** | **950** | **675** | **275** | **-** |

**07. 2024.12.31 දිනට ළඟා කරගත් ඉලක්ක**

අ. තරුණ පුහුණු වැඩසටහන්

| වැඩසටහන් | 2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන (සංශෝධිත) (රු.මි.) | වාර්ෂික ඉලක්කය | | අත්පත් කරගත් ප්‍රගතිය (භෞතික) % | භෞතික ප්‍රගතිය විස්තරාත්මකව |
|---|---|---|---|---|---|
| | | 1 කණ්ඩායම | 11 කණ්ඩායම | | |
| ජීවන කුසලතා පුහුණු පාඨමාලාව | 96.71 | 4850 | 4900 | 100 % | පළමු කණ්ඩායමේ බඳවා ගත් සංඛ්‍යාව - 3664<br>දෙවැනි කණ්ඩායමේ බඳවාගත් සංඛ්‍යාව - 3823<br>තෙවනි කණ්ඩායමේ බඳවා ගත් සංඛ්‍යාව - 1363<br>විශේෂ ජීවන කුසලතා පාඨමාලාව (දින 14) – 6101<br>මුළු එකතුව - 14951 |
| තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව - ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය(SIBA) අනුබද්ධිතව | 56.00 | 3500 | 3500 | 100 % | I කණ්ඩායම – IT – 3107<br>I කණ්ඩායම – Eng – 2998<br>II කණ්ඩායම – Eng – 2496<br>II කණ්ඩායම – IT – 1276<br>**එකතුව – 9877** |
| බැහැරගත පුහුණුව | 12.00 | 4850 | 4900 | 88 % | 8653 පුහුණුව අවසන් කර ඇත. |





➢ **ජීවන කුසලතා පුහුණු පාඨමාලාව යටතේ පවතින වැඩසටහන්**

| වැඩසටහන් | 2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.) | වාර්ෂික ඉලක්කය | අත්පත් කරගත් ප්‍රගතිය (භෞතික) % | භෞතික ප්‍රගතිය විස්තරාත්මකව |
|---|---|---|---|---|
| ලිංගික සම්ප්‍රේෂණ රෝග වැළැක්වීමේ වැඩසටහන | 0.22 | වැඩසටහන් 112 | 100 % | වැඩසටහන් 112 අවසන් කර ඇත. |
| බෝ නොවන රෝග වැළැක්වීමේ වැඩසටහන | 0.22 | | 100 % | |

| | | | | |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 0.22 | | 100 % | වැඩසටහන් 112 අවසන් කර ඇත. |
| අපදා කළමනාකරණ වැඩසටහන් | 0.22 | | 100 % | වැඩසටහන් 112 අවසන් කර ඇත. |
| මනෝ උපදේශන වැඩසටහන් | 0.45 | | 100 % | වැඩසටහන් 112 අවසන් කර ඇත. |
| නවෝත්පාදන හා නව නිපැයුම් | 1.80 | | 100 % | වැඩසටහන් 112 අවසන් කර ඇත. |
| ක්ෂේත්‍ර චාරිකා | 2.15 | | 99 % | වැඩසටහන් 111 ක් අවසන් කර ඇත |

**ආ. බාහිර පාර්ශ්ව සඳහා විශේෂ පුහුණු වැඩසටහන්**

| වැඩසටහන් | 2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.) | වාර්ෂික ඉලක්කය | අත්පත් කරගත් ප්‍රගතිය (භෞතික) % | භෞතික ප්‍රගතිය විස්තරාත්මකව |
|---|---|---|---|---|
| බාහිර පාර්ශව සඳහා ධාරිතා සංවර්ධන සහ නායකත්ව පුහුණු වැඩසටහන් | 0.50 | 50,000 (පුහුණුලාභීන්) | 100 % | 51,372 ක් සඳහා පුහුණු වැඩසටහන් සිදු කර ඇත. |
| පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් | 1.50 | 50,000 (පුහුණුලාභීන්) | 100 % | 72,733 ක් සඳහා ශිෂ්‍ය නායක වැඩමුළු පවත්වා ඇත. |





**ඇ. තරුණ සංවර්ධන වැඩසටහන්**

| වැඩසටහන් | | 2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන සංශෝධිත (රු.මි.) | වාර්ෂික ඉලක්කය | අත්පත් කරගත් ප්‍රගතිය (භෞතික) % | භෞතික ප්‍රගතිය විස්තරාත්මකව |
|---|---|---|---|---|---|
| සංහිඳියා වැඩසටහන | | 2.13 | 2 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| ක්‍රීඩා උත්සවය | මධ්‍යස්ථාන | 0.70 | 112 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| | පළාත් | 1.39 | 9 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ජාතික | 5.00 | 1 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| කලා උළෙල | මධ්‍යස්ථාන | 0.70 | 112 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| | පළාත් | 4.50 | 9 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| පෞරුෂාභිමාන | | 12.70 | 1 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| "Y – Art" ප්‍රදර්ශනය | | 3.55 | 100 (පුහුණුලාභීන්) | 100 % | 152 ක් සහභාගී විය. |
| විසිරයාමේ පෙළපාලිය | | 10.10 | 112 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| වෙසක් උත්සවය | | 0.60 | 56 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |
| පොසොන් උත්සවය | | 0.38 | 56 (වැඩසටහන්) | 100 % | සම්පූර්ණ කර ඇත. |





**ඇ. වෘත්තීය පුහුණු වැඩසටහන්**

| වැඩසටහන් | 2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන සංශෝධිත (රු.මි.) | වාර්ෂික ඉලක්කය | අත්පත් කරගත් ප්‍රගතිය (භෞතික) % | භෞතික ප්‍රගතිය විස්තරාත්මකව |
|---|---|---|---|---|
| වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම් | 26.40 | 830 (පුහුණු ලාභීන්) | 100 % | 1313 ක් වෘත්තීය පුහුණුව සඳහා යොමු කර ඇත. |
| හෝටල් පුහුණු පාසල - දඹුල්ල | 50.15 | 500 (පුහුණු ලාභීන්) | 96 % | පිළිගැනීමේ අංශය - 27<br>ආහාරපාන පිළිගැන්වීම - 60<br>වෘත්තීය සූපවේදය - 149<br>පේස්ට්‍රි හා බේකරි - 74<br>ගෘහ පාලනය - 89<br>සහකාර බංගලා භාරකරු - 82<br>මුළු සංඛ්‍යාව **- 481** |

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් රැකියා ඉලක්කකරගත් පුහුණු වැඩසටහන (**Other Job Oriented Training program**) | 3.00 | 80 (පුහුණු ලාභීන්) | 56 % | Marine Welding Fitter – 39<br>Welding Tech 4G – 06<br>මුළු සංඛ්‍යාව **- 45** |
| භාෂා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා | 0.70 | 1,000 (පුහුණු ලාභීන්) | 82 % | 818 ක් මේ වන විට භාෂා පුහුණුව පාඨාමලාව සඳහා සම්බන්ධ වි ඇත. |
| බෙරවාදන හා නර්ථනය, සංගීතය යන පාඨමාලා | 22.38 | 100 (පුහුණු ලාභීන්) | 98 % | බෙරවාදන හා නර්තනය - 80<br>සංගීතය - 18<br>මුළු සංඛ්‍යාව **- 98** |
| ව්‍යවහාරික තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව | 0.00 | 200 (පුහුණු ලාභීන්) | 100 % | 214 ක් 2024 වර්ෂය සඳහා සම්බන්ධ වී ඇත. |
| SWISS හෝටල් කලමනාකරණ පුහුණු පාඨමාලාව | 0.00 | - | - | මේ වන විට පුහුණුලාභීන් 643 ක් මේ හා සම්බන්ධ විඇත. |





**ඉ.** ධාරිතා සංවර්ධනය

| වැඩසටහන් | 2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන සංශෝධිත (රු.මි.) | වාර්ෂික ඉලක්කය | ළඟාකරගත් සමස්ත ඉලක්කය | අත්පත් කරගත් ප්‍රගතිය (භෞතික) % | භෞතික ප්‍රගතිය විස්තරාත්මකව |
|---|---|---|---|---|---|
| පුහුණුකරුවන් පුහුණු කිරීම | 6.20 | 12 (වැඩසටහන්) | 8 වැඩසටහන් | 58 % | පුහුණු වැඩසටහන් 07 සම්පූර්ණ කරන ලදී. |
| කාර්යය මණ්ඩල පුහුණුව | 3.00 | 10 (වැඩසටහන්) | 06 වැඩසටහන් | 60 % | වැඩසටහන් 06 ක් අවසන් කර ඇත. |
| කාර්යය මණ්ඩල සඳහා වූ ශිෂ්‍යත්ව | 1.50 | 15 (ශිෂ්‍යත්ව) | 19 ශිෂ්‍යත්ව | 100 % | ශිෂ්‍යත්ව 19 ක් කාර්ය මණ්ඩල සඳහා ලබා දී ඇත. |

## 08.සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මිලි) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව (රු.මිලි) | 2024.12.31 ට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය (සමුච්චිත) % |
|---|---|---|---|---|---|---|
| 1 | දඹුල්ල දිගම්පතන පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම | 29.80 | 34.60 | 11.56 | 33 % | 95 % |
| 2 | හලාවත මාදම්පේ පුහුණු මධ්‍යස්ථානය | 65.00 | 85.90 | 41.43 | 48 % | 90 % |
| 3 | සූරිය වැව පුහුණු මධ්‍යස්ථානය | 30.80 | 42.00 | 36.94 | 88 % | 100 % |
| 4 | කතරගම හෝටල් පුහුණු පාසල ඉදිකිරීම | 105.00 | 95.00 | 31.10 | 33 % | 95 % |
| 5 | නාඋල අදියර 02 නේවාසිකාගාරය | 40.00 | 84.10 | 56.78 | 67 % | 100 % |
| 6 | කටුනායක වැසිකිළි පද්ධතිය | 7.00 | 7.00 | 5.44 | 78 % | 100 % |

## 09.වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2024.12.31 දිනට

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රු.මි.) | % |
| පුනරාවර්තන වියදම | 1215.00 | 1274 | 1094 | 85.87 % |
| ප්‍රාග්ධන වියදම | 550.00 | 550.00 | 406 | 73.81 % |
| **එකතුව** | **1765.00** | **1824** | **1500** | **82.23 %** |

## 10. 2024 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ

### අ. ජාතික මට්ටමින් අන්තර් පළාත් ක්‍රීඩා තරඟාවලියක් පැවැත්වීම

යොවුන් සේනාංකයේ අන්තර් පළාත් ක්‍රීඩා තරඟාවලියක් අවසන් වරට 2016 වසරේ පවත්වා ඇති අතර, වසර 08 කට පසු මෙම වර්ෂයේ දී එම ක්‍රීඩා තරඟාවලිය අති උත්කර්ෂවත් ලෙස දිවුලපිටිය ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානයේ දී, ජාතික යොවුන් සේනාංක අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සුජීව රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම තරඟාවලිය සඳහා සියළුම පළාත් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වූ අතර වොලිබෝල්, නෙට්බෝල්, දුනු විදීම හා වායු රයිෆල් වෙඩි තැබීම අංශයන්ගේ විශේෂ දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනිමට හැකියාව ලැබුණි.



**ආ. පළාත් විසිරයාමේ පෙළපාලිය**

2024 වර්ෂයේ ජීවන කුසලතා පාඨමාලාවේ පළමු කණ්ඩායම සඳහා බඳවාගත් යොවුන් ශිෂ්‍යභටයින්ගේ විසිරයාමේ පෙළපාලි දිවයින පුරා මධ්‍යස්ථාන මට්ටමින් පැවති අතර බස්නාහිර පළාතේ පිහිටි පුහුණු මධ්‍යස්ථාන සියල්ලම සහභාගීවූ පළාත් විසිරයාමේ පෙළපාලිය අත්තනගල්ල පුහුණු මධ්‍යස්ථානයේ දී 2024 අගෝස්තු මාසයේ දී පවත්වන ලදී. මෙම විසිරයාමේ පෙළපාලියේ ප්‍රධාන අමුත්තා ලෙස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කේ. මහේසන් මැතිතුමා සහභාගී විය.



**ඇ. Y – Rhythm 2024 රියැලිටි වැඩසටහන**

යොවුන් සේනාංකයේ පුහුණුව ලබන යොවුන් ශිෂ්‍යභටයින්ගේ ගායන හැකියාවන් හඳුනා ගැනීම, හා ඔවුන් සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම "යථාර්තය බලගන්වන සිහිනයේ අවකාශය **Y – Rhythm 2024**" වැඩසටහනේ මූලික අරමුණ වන අතර මෙම වැඩසටහන සෞන්දර්ය නිකේතනයේ පුහුණුව ලබන සෞන්දර්ය ශිෂ්‍යභටයින්ගේ ඇගයීම් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහනේ මූලික අදියර සඳහා සියළුම මධ්‍යස්ථානවල ගායන හැකියාවන් සහිත යොවුන් ශිෂ්‍යභටයින් සහභාගී වූ අතර, ඉන්පසු පළාත් මට්ටමින් තෝරාගත් එක් පළාතකින් තිදෙනෙකු බැගින් අවසන් තරඟකරුවන් 27දෙනෙකු දෙවන අදියර සඳහා සහභාගී විය. මෙම තරඟාවලිය අදියර 06කින් සමන්විත වූ අතර, අවසන් තරඟය යොවුන් සේනාංක දිනය සමරනු ලැබූ 2024 දෙසැම්බර් 17 වන දින තරුණ කටයුතු හා කිඩා අමාත්‍යාංශයේ ඩන්කන්වයිට් ශ්‍රවණාගාරයේ දී පැවත්විය.







**ඇ. සංයුක්ත සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම**



යොවුන් සේනාංකය සඳහා දීර්ඝ කාලයක් සංයුක්ත සැලැස්මක් සම්පාදනය කර නොතිබූ අතර ඒ පිළිබඳව වරින් වර විගණන විමසුම් මඟින් ද කරුණු විමසා තිබිණ. 2024 – 2028 පස් වසර සඳහා සම්පාදනය කරන සංයුක්ත සැලැස්ම මේ වන විට ප්‍රකාශයට පත් කර ඇති අතර යොවුන් සේනාංකයේ ඉදිරි සියළු වැඩසටහන් ඒ අනුව ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් පවතී.

**ඉ. මහපොළ ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම**

වසර ගණනාවකට පසු ආරම්භ වූ මහපොළ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා ජාතික යොවුන් සේනාංකය සහභාගී වූ අතර අතර එහි දී, යොවුන් සේනාංකයේ සේවාවන් හා කාර්යබාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරිමට කටයුතු කරන ලදී. විශේෂයෙන් දඹුල්ල ඉනාමලුව පිහිටි හෝටල් පුහුණු පාසලේ පවත්වාගෙන යනු ලබන ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලා පිළිබඳ මෙහිදී, ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි තරුණ තරුණියන්ගේ අවධානය යොමු වූ බව නිරීක්ෂණය විය.

**ඊ. Skill Up රැකියා හා වෘත්තීයපොළට සහභාගී වීම**

ලෝක තරුණ නිපුණතා දිනය සැමරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය මඟින් කටුබැද්ද ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යාලයේ පවත්වන ලද Skill Up රැකියා හා වෘත්තීයපොළට යොවුන් සේනාංකය ප්‍රදර්ශන කුටියක් එකතු කරන ලදී. එහි දී වෘත්තීය අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් තොරතුරු සොයන තරුණ තරුණියන්ට යොවුන් සේනාංකයේ ජීවන කුසලතා පාඨමාලාව හා හෝටල් පාඨමාලා පිළිබඳව අවබෝධයක් ලබා දීමට හැකිවිය.

**උ. ජීවන කුසලතා විෂය මාලාව සංවර්ධනය කිරීම**

අඛණ්ඩව දීර්ඝ කාලයක් කිසිඳු සමාලෝචනයකින් තොරව ක්‍රියාත්මක කරන ලද ජීවන කුසලතා පාඨමාලාවේ විෂය නිර්දේශය සමාලෝචනය කොට අනාගත ලෝකයට ගැළපෙන ගෝලීය පුරවැසියෙක් ගොඩනැඟීම සඳහා ගැළපෙන පරිදි ජීවන කුසලතා පාඨමාලාවේ විෂය ධාරාව මෙම වර්ෂයේ දී සංවර්ධනය කරන ලදී. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් අවශ්‍ය විශේෂඥ සහය ලබා දෙන ලදී. ඒ අනුව මේ වන විට සම්පූර්ණ විෂය කොටස් මොඩියුල 09 ක් ලෙස ගොනු කොට භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කර ඇත. එමෙන්ම ඊට අනුව පුහුණුකරුවන් ද පුහුණු කොට ජීවන කුසලතා පාඨමාලාවට නව විෂය නිර්දේශයන් හඳුන්වා දී ඇත.



### ඍ. SWISS හෝටල් කලමනාකරණ පුහුණු පාඨමාලාව

ස්විට්සර්ලන්ත ජනරජය, ශ්‍රී ලංකාවේ බවර් ආයතනය හා යොවුන් සේනාංකය ඒකාබද්ධව මෙම හෝටල් කලමනාකරණ පුහුණු පාඨමාලාව මෙහෙයවනු ලබයි. දැනට දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 10ක පුහුණුලාභීන් 646 දෙනෙකු මෙම පාඨමාලාව සඳහා සහභාගී වී ඇත. මාස 09ක් පුරා පැවැත්වෙන මෙම පාඨමාලාව මාස 04ක රැකියා පුහුණුවකින් ද යුක්ත වන අතර පාඨමාලාව සාර්ථක අවසන් කරන්නන් හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීමට කටයුතු කෙරේ.

### එ. උසස් පෙළ සිසුන් සඳහා ජීවන කුසලතා පුහුණුව

2024 වර්ෂයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ පන්ති සඳහා යොමු වන තෝරාගත් පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දින 14 ක ජීවන කුසලතා පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලදී. එමඟින් තම අධ්‍යාපන ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා සහ පැතුම් තල සංවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන ලද අතර මෙම වැඩසටහන සඳහා මේ වන විට ශිෂ්‍ය ශෂ්‍යාවන් 5635ක ප්‍රමාණයක් සහභාගී වී ඇත.

### ඒ. යොවුන් ශිෂ්‍යභටයින් සඳහා බැහැරගත පුහුණුව නාවුල දී

ජීවන කුසලතා පාඨමාලාව හදාරනු ලබන යොවුන් ශිෂ්‍යභටයින් සඳහා බැහැරගත පුහුණුව ඒ ඒ මධ්‍යස්ථාන ආශ්‍රිතව සිදු කල ද, නාවුල පිහිටි ධීර අභ්‍යාස පුහුණු මධ්‍යස්ථානයේ දී ධීර අභ්‍යාස වැඩසටහනකට සහභාගී වීම සෑම යොවුන් ශිෂ්‍යභටයකුගේම සිහිනයක්ව පවතී. ඒ පිළිබඳව අවධානය යොමු කල යොවුන් සේනාංක අධ්‍යක්ෂතුමා විසින් සෑම පළාතකින්ම 100 දෙනෙකු සඳහා නාවුල පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණුව ලබා දීමට අවස්ථාව උදාකර දී ඇත. ඒ අනුව පළමු අදියරේ දී යොවුන් ශිෂ්‍යභටයින් 900ක් මේ වන විට පුහුණු අවසන් කර ඇති අතර දෙවන අදියරේ තවත් 900දෙනෙකු පුහුණු කිරීමට කටයුතු කරමින් පවතී.

### ඔ. කාර්ය මණ්ඩල සුභ සාධනය සඳහා ආපදා ණය යෝජනා ක්‍රමය ආරම්භ කිරීම

මෙතෙක් යොවුන් සේනාංක කාර්යය මණ්ඩ සමාජිකයින්ට ආපදා ණය යෝජනා ක්‍රමයක ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව උදා වී නොතිබුණි. මේ පිළිබඳ අවධානය යොමු කල යොවුන් සේනාංක  අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සුජීව රත්නායක මැතිතුමා විසින් ඒ පිළිබඳව රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට ආපදා ණය යෝජනා ක්‍රමයක් මේ වන විට ක්‍රියාත්මක කර තිබේ. එය කාර්යය මණ්ඩල බොහෝ දෙනාගේ සුභ සාධනය සඳහා ඉවහල් වී ඇති බව අයඳුම්කරනු ලබන ණය ප්‍රමාණය අනුව තීරණය කල හැක.

### ඕ. සෞන්දර්ය ශිෂ්‍යභටයින් සඳහා රැකියා අවස්ථා  විවර කර ගැනීම

යක්කල සෞන්දර්ය නිකේතනයේ ගායනවේ දී හා නර්තන හා බෙර වාදන පාඨමාලා හාදාරන ජාතික වෘත්තීය සුදුසුකම් IV වන මට්ටම හා VI මට්ටම සහතික හිමි කරගන්නා සෞන්දර්ය ශිෂ්‍යභටයින් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ රැකියා අවස්ථා ලබා දීමට එම හමුදාවන්ගේ සෞන්දර්ය අංශ අධ්‍යක්ෂවරුන් මේ වන විට ඉදිරිපත්ව සිටියි. ඒ පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් 02ක් යක්කල පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය.

### ක. වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමක්

යොවුන් සේනාංකයේ ජීවන කුසලතා පාඨමාලාව හාදාරන යොවුන් ශිෂ්‍යභටයින් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමට ප්‍රමුඛ පාර්ශවකරුවක් ලෙස වෘත්තීය පුහුණු අධිකාරිය හඳුනා ගත හැක. එම කාර්යයයේදී දැනට මුහුණ දෙන ගැටළු නිරාකරණය කර ගනිමින් වෘත්තීය පුහුණු

ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන මෙම අවබෝධතා ගිවිසුම මඟින් සම්පාදනය කර ඇත.

**ග. තරුණ තරුණියන් 100,000 ක් පුහුණු කිරීම**

2024 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන විට යොවුන් සේනාංකයේ කුමන හෝ පාඨමාලාවක් සඳහා සහභාගී වී ජීවන කුසලතා පුහුණුව ලබන ලද, තරුණ තරුණියන් සංඛ්‍යාව 108,123 කි. එම තත්ත්වය යොවුන් සේනාංකය 2024 වර්ෂයේ දී ලබන ලද විශාල ජයග්‍රහණයක් ලෙස හඳුන්වා දිය හැක.





**11.ඉදිරි ඉලක්ක 2024-2028**

- 2028 වනවිට රැකියා වෙළඳපොළ ප්‍රවනතාවයන්ට ගැලපෙන නිපුණතාවයන්ගෙන් යුත් පුහුණු ශ්‍රමිකයින් 113 580 ක් දේශීය හා විදේශීය වශයෙන් රැකියාගත වීම.
- 2028 වනවිට 168,000 ක් වූ ඉලක්කගත තරුණ ප්‍රජාව අනාගත වැඩලෝකයට ගැලපෙන ජීවන කුසලතාවලින් යුක්ත වීම.
- 2028 වනවිට ඉලක්කගත ප්‍රතිලාභීන් 3300ක් තෝරාගත් විශේෂිත ඉසව් යටතේ අන්තර්ජාතික ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට ගැලපෙන සුදුසකම්ලත් පුහුණුලාභීන් බවට පත්වීම.
- 2028 වනවිට සමාජ, ආර්ථික, සංස්කෘතික හා පාරිසරික වශයෙන් බලගැන්වූ ආයතන 60 ක් වූ පුහුණු මධ්‍යස්ථාන පද්ධතියක්.
- 2028 වනවිට ආකර්ශනීය පුහුණු මධ්‍යස්ථාන ජාලයක් ස්ථාපිත වීම.
- 2028 දී 20% ක ස්වයං මූල්‍යයන ආයතනයක්.
- 2027 දී සන්නාමගත සහතිකකරණයකින් යුත් ආයතනික පද්ධතියක්.
- 2028 වනවිට අන්තර්ජාතිකව තහවුරු කරන ලද තත්ත්ව කළමනාකරණ පද්ධති සහිත ආයතනයක්.
- 2025 වනවිට කළමනාකරණ දත්ත පද්ධතියක් (MIS) හා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) ස්ථාපිත වීම.

# නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

# 2024

## ප්‍රගති වාර්තාව

## නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

### 01.හැඳින්වීම

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් යෝධගම ග්‍රාම නිලධාරී වසමෙහි මනරම් භූමි භාගයක නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය පිහිටා ඇත.

1985 ජූනි 23 දින පවත්වන ලද ගම්උදා ප්‍රදර්ශන භූමියේ රටේ සුවිශේෂී ගොඩනැගිලිවල ආකෘති (පාර්ලිමේන්තුව, අරලියගහ මන්දිරය) අනුව සකස් කල ස්ථිර ගොඩනැගිලිවලින් යුත් භූමි භාගය "යෝධගම ග්‍රාමයක්" ලෙස ගොඩනගන ලදි. ප්‍රදර්ශනය නිම වීමෙන් පසු, එවකට ගරු අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතාගේ උපදෙස් පරිදි එතෙක් පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශය යටතේ පැවති මෙම භූමිය, පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් 1985.09.15 දින සිට අක්කර 35 ක භූමි භාගයක් පුරා විසිරී තිබූ ගොඩනැගිලි හා භූමිය මුල්කරගෙන පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කර ඇත.

එකල ගම්මාන මට්ටමින් ආරම්භ කර ඇති ග්‍රාමෝදය මණ්ඩලයන්හි නිලධාරීන් පුහුණු කිරීම අරමුණු කරගෙන පුහුණු කටයුතු ආරම්භ වී ඇති අතර ඊට උචිත වන පරිදි "ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය ලෙස මෙම ආයතනය නම් කර ඇත. පසු කාලීනව විවිධ අමාත්‍යාංශයන් යටතේ පහත සඳහන් ආකාරයට විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- ජනසවිය වැඩසටහනේ කුඩා කණ්ඩායම් පුහුණු කිරීම.
- ග්‍රාමෝදය මණ්ඩල සභාපතිවරු පුහුණු කිරීම.
- පළාත් පාලන ආයතනවල නියෝජිතයින් පුහුණු කිරීම.
- ප්‍රජාමූල මණ්ඩලවල නායකයින් පුහුණු කිරීම.
- සමෘද්ධි කළමනාකරුවන්, කුඩා කණ්ඩායම්, ජන පුබුදු ප්‍රතිලාභීන් සඳහා ව්‍යවසායකත්ව පුහුණු.
- සමෘද්ධි ප්‍රතිලාභී පිළිසරණ කාන්තා වැඩසටහන්

ඉන් අනතුරුව, 2013 වර්ෂයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතට මෙම ආයතනය පත්වූ අතර එම කාල වකවානුව වන විට ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමට අමතරව මධ්‍යස්ථාන කාර්යභාරය විවිධ පාර්ශවයන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම ලෙස වෙනස් ව තිබූ බැවින් විශේෂ කැබිනට් පත්‍රිකාවක් මගින් එතෙක් පැවති "ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය'', "නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය" ලෙස නම් කරන ලද අතර එහි විෂය පථය ද වෙනස් විය. 2020 වර්ෂයේ සිට මෙම පුහුණු මධ්‍යස්ථානය යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට පත් වූ අතර වර්තමානයේද එම අමාත්‍යාංශය යටතේ පාලනය වේ. මේ වන විට මෙම මධ්‍යස්ථානය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන මාණ්ඩලික නිලධාරීන් ඇතුළු 62 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේ පාසල් සිසුන්, තරුණ තරුණියන්, රාජ්‍ය හා පුද්ගලික අංශයේ නිලධාරීන්, ග්‍රාමීය නායකයින් සඳහා නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීමයි. මීට අමතරව බාහිර පාර්ශවයන් විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා නවාතැන් පහසුකම්, ආහාර, දේශන ශාලා ආදිය සපයනු ලබයි.

ආයතනය සතුව පැවති නේවාසික පහසුකම් ධාරිතාවය 265 ක් පමණ වූ අතර 2023 වර්ෂයේ ඉහත සඳහන් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මගින් නේවාසික පහසුකම් 400 දක්වා ඉහළ නංවා ගැනීමට හැකි විය. එසේම කෝවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම හා ආර්ථික අර්බුධකාරී

තත්ත්වය හේතුවෙන් නිසි වේලාවට අක් මුදල් නොලැබීම මත පුහුණු වැඩසටහන් නොමිලේ පැවැත්වීම අපහසු විය.

මේ සඳහා විසඳුමක් ලෙස වසර 38ක පමණ කාලයක් කිසිඳු අයකිරීමකින් තොරව පවත්වන ලද නායකත්ව පුහුණු වැඩසටහන් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස සිට මුදල් අය කර සිදු කිරීම ආරම්භ කරන ලද අතර පාසල් සිසුන් සහභාගි වන වැඩසටහන් සඳහා පමණක් නවාතැන්, දේශන ශාලා ආදිය නොමිලේ ලබා දී ආහාර සැපයීම සඳහා වන වියදම් පමණක් අය කරනු ලබයි. එසේම නායකත්ව සංවර්ධන පුහුණුව වර්තමාන ඉල්ලුමට අනුව සැපයීමේ අරමුණින් වික්‍රමාන්විත ක්‍රියාකාරකම් (Adventure Based Training) සඳහා අවශ්‍ය පුහුණු අයිතමයන් සකස් කරන ලදි.

ඒ අනුව වර්තමානය වන විට මෙම මධ්‍යස්ථානය එකවර 400 පමණ පුහුණු ලාභීන් සංඛ්‍යාවකට නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාර (වායු සමනය කරන ලද කාමර 11 ක් ඇතුළත්ව) 13 ක් , 400 කට එකවර අසුන් ගත හැකි වායු සමනය කරන ලද සම්මන්ත්‍රණ ශාලාවක්, තවත් දේශන ශාලා 04 ක් සහ එකවර 150 කට ආහාර ගත හැකි අංගසම්පූර්ණ භෝජනාගාරයකින්, නිල නිවාස 16 ක් හා ප්‍රධාන කාර්යාලය ඇතුලු ගොඩනැගිලි 47 කින් සහ මනරම් නිදහස් භූමි භාගයකින් යුක්ත වේ. එමෙන්ම වික්‍රමාන්විත ක්‍රියාකාරකම් (Adventure Based Training) ආශ්‍රිත පුහුණු පිටියක්ද මධ්‍යස්ථානය සතුව පවතී.

මේ සියළු නවීකරණයන්හි ප්‍රතිඵලයක් වශයෙන් පුහුණු වැඩසටහන් සඳහා සතුටුදායක ඉල්ලුමක් පවතින අතර 2024 වර්ෂය සඳහා මිලියන 31 කට අධික මුදලක් ආදායම ලෙස ඉපයීමට හැකි විය.

## 02.දැක්ම

" නායකත්ව කුසලතාවයන්ගෙන් හෙබි යෞවන ප්‍රජාවක් "

## 03.මෙහෙවර

ඵලදායි පුහුණු හා පර්යේෂණ තුළින් යෞවන ප්‍රජාවගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම.

## 04.අරමුණු

- පාසල් සිසුන් හා යෞවන ප්‍රජාවගේ නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධනය පිණිස පුහුණු වැඩසටහන් නව්‍යකරණය
- වෘත්තීය ක්ෂේත්‍රයන් තුළ සාර්ථකත්වයට , අධ්‍යාත්මික ප්‍රාග්ධනයෙන් යුතු ප්‍රජාවක් බිහි කිරීම
- රටේ සංවර්ධනයට දායකවීම පිණිස, නිර්මාණශීලී, අන්‍යෝන්‍ය අවබෝධයක් සහිත, සංවාදශීලී, සඵලදායී තීරණ ගත හැකි ප්‍රජාවක් බිහි කිරීම.
- ප්‍රජා නායකත්වය පිණිස තරුණ පරපුර මෙහෙය වීම.
- ජාතික පුහුණු අවශ්‍යතා සපුරාලන පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම.

## 05. ප්‍රධාන කාර්යයන්

ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම වන අතර මෙම කටයුතු පහසුකරණය සඳහා ආයතන, සංවර්ධන, ගිණුම්, පුහුණු හා නඩත්තු අංශ ලෙස බෙදා වෙන්කොට ඇත. එක් එක් අංශයන්හි කාර්යභාරයන් පහත පරිදි වේ.

### 01. ආයතන අංශය

- දෛනික පරිපාලන කටයුතු
- උසස්වීම්, විනය පාලනය, කාර්ය සාධනය හා විශ්‍රාම ගැන්වීමට අදාල කටයුතු.

- පුහුණු නිලධාරීන් සහ සමස්ථ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- ආයතනය සතු වාහන නඩත්තුව හා ඊට අදාළ කටයුතු
- ලේඛනාගාර නඩත්තු කටයුතු

**02. ගිණුම් අංශය**

- මූලා ඇස්තමේන්තු සැකසීම , වියදම් වාර්තා කිරීම හා අධීක්ෂණය
- ප්‍රසම්පාදන කටයුතු
- වත්කම් පාලනය
- විගණනය සඳහා තොරතුරු සැපයීම.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සීමාවන් ඉක්මවන අවස්ථාවන්හිදී ඊට අදාල කාර්යයන් සිදු කිරීම.

**03. පුහුණු අංශය**

- පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ඒ ඒ පුහුණුලාභීන් හට සුදුසු වන පරිදි පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම
- පුහුණු සැසි සැලසුම් සකස් කිරීම
- පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය සැපයීම
- පාසල් සිසුන් සඳහා වන පුහුණු වැඩසටහන් පසු ඇගයීම් කටයුතු
- පුහුණු වැඩසටහන් ඇගයීම් සාරාංශකරණය හා සුදුසු පරිදි පුහුණු කටයුතු විවිධාංගීකරණය කිරීම
- පුහුණු උපකරණ නිර්මාණය හා සංවර්ධනය

**04. සැපයුම් අංශය**

- පුහුණු කටයුතු සඳහා වන ඇණවුම් යොමු කිරීම
- ආහාර ද්‍රව්‍ය භාර ගැනීම
- මුළුතැන්ගෙය වෙත නිකුත් කිරීම
- මුළුතැන්ගෙය අධීක්ෂණ කටයුතු

**05. සංවර්ධන හා නඩත්තු අංශය**

- ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම
- අක්කර 35 භූමිය අලංකාරවත් ලෙස තබාගැනීම.
- යටිතල පහසුකම් සංවර්ධනය හා පවත්වාගෙන යාම

**06.මානව සම්පත් පැතිකඩ**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 5 | 3 | 2 | - |
| තෘතියික | 1 | 1 | - | - |
| ද්විතියික | 37 | 35 | 02 | - |
| ප්‍රාථමික | 33 | 27 | 06 | - |
| **එකතුව** | **76** | **66** | **10** | **-** |

**07.2024 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය % | 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 15 | 15 | 100% | 100% |
| 02 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු | 01 | 01 | 100% | 100% |
| 03 | වාහන නඩත්තු | 1.5 | 1.5 | 100% | 100% |
| 04 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය අවශ්‍යතා මිල දී ගැනීම් | 02 | 02 | 100% | 100% |
| 05 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම් | 01 | 01 | 100% | 100% |
| 06 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | 2.5 | 01 | 40% | 70% |
| 07 | නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | 25 | 20.4 | 81% | 85% |

**2024 වර්ෂයේ පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන් වර්ගය | වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුලාභීන් සංඛ්‍යාව | ආදායම (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| 01. | පාසල් ශිෂ්‍ය නායකයන් සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | 30 | 2151 | 4.9 | 4.97 |
| 02. | යෞවන ප්‍රජාව සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | 10 | 870 | 2.3 | 1.63 |
| 03. | රාජ්‍ය නිලධාරීන් සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | 19 | 1302 | 5.2 | 3.5 |
| 04. | ප්‍රජාමූල සංවිධානවල ක්‍රියාකාරීන් සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | 02 | 190 | 0.4 | 0.85 |
| 05. | විෂය මූලික පුහුණු වැඩසටහන් | 30 | 3088 | 15.4 | 9.44 |
| 06. | පසු විපරම් වැඩසටහන් | 21 | 1173 | - | 0.05 |
| **එකතුව** | | **112** | **8774** | **28.2** | **20.4** |

01.අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් වල ආදායම = රු 28,187,977.00

02.පහසුකම් සැපයීම මගින් ලද උත්පාදන වැඩසටහන්වල ආදායම = රු. 4,299,331.00

03.ඡායාරූප ආදායම = රු. 104,250.00

**= රු. 32,591,558.00**

**08.**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය **2024.12.31** දිනට

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
| පුනරාවර්තන වියදම | 71.28 | 70 | 98% |
| ප්‍රාග්ධන වියදම | 48 | 42 | 87% |
| එකතුව | 119.28 | 111.42 | 94% |

**09.2024** වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ

- Adventure Based Training ආරම්භ කිරීමට අවශ්‍ය පිටිය සකස් කිරීම සහ පුහුණු කටයුතු ආරම්භ කිරීම.






- නේවාසිකාගාර අලුත්වැඩියා කිරීමෙන් සහ භාවිතයට නොගත් නිල නිවාස නේවාසිකාගාර බවට පත් කරමින් මධ්‍යස්ථානයේ 265 කට ආසන්නව පැවති නේවාසික ධාරිතාව 400 දක්වා ඉහල නැංවීමට කටයුතු කිරීම.




**10.ඉදිරි ඉලක්ක 2025-2028**

| අනු අංකය | වැඩසටහනේ නම | ඉලක්කගත ප්‍රතිලාභීන් | | **2025** | **2026** | **2027** | **2028** |
|---|---|---|---|---|---|---|---|
| 01. | පාසල් සිසුන් සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | පාසල් සිසුන් | වැඩසටහන් සංඛ්‍යාව | 60 | 65 | 65 | 70 |
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 3600 | 3900 | 3900 | 4200 |
| 02. | යෞවන ප්‍රජාව සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | තරුණ ප්‍රජාව | වැඩසටහන් සංඛ්‍යාව | 20 | 20 | 20 | 20 |
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1200 | 1200 | 1200 | 1200 |
| 03. | රාජ්‍ය නිලධාරීන් සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | රාජ්‍ය නිලධාරීන් | වැඩසටහන් සංඛ්‍යාව | 10 | 10 | 10 | 10 |
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 600 | 600 | 600 | 600 |
| 04. | ප්‍රජා මූල සංවිධාන ක්‍රියාකාරීන් සඳහා වන නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් | ග්‍රාමීය ප්‍රජාමූල හා ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරීන් | වැඩසටහන් සංඛ්‍යාව | 10 | 10 | 10 | 10 |
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 600 | 600 | 600 | 600 |
| 04. | විෂය මූලික පුහුණු වැඩසටහන් | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල නිලධාරීන් | වැඩසටහන් සංඛ්‍යාව | 60 | 60 | 60 | 60 |
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 3600 | 3600 | 3600 | 3600 |
| 04. | පසු විපරම් වැඩසටහන් | නායකත්ව පුහුණුව ලබා ගත් පාසල් සිසුන් | වැඩසටහන් සංඛ්‍යාව | 25 | 25 | 25 | 25 |
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1500 | 1500 | 1500 | 1500 |

# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

# 2024

## ප්‍රගති වාර්තාව

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

### 01.හැඳින්වීම

ක්‍රීඩා පාසල නමින් 1979 වර්ෂයේදී ආරම්භ වූ මෙම ආයතනය 1998 වර්ෂයේදී විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ලෙස ස්ථාපිත කරන ලදී . ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වෙමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් ක්‍රීඩා දැනුම සමාජගත කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබයි.

දේශීය සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ළඟා කර ගැනීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම මෙන්ම ක්‍රීඩාවේ විවිධ ස්ථරයන්ගේ මානව සම්පත් සංවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ක්‍රියාශීලී දිවිපෙවෙතක් උරුම කර දීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග සහ සැලසුම් තුළින් අරමුණු කෙරේ.

### 01. දැක්ම

ක්‍රීඩා අධ්‍යාපනයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයතනය වීම.

### 03.මෙහෙවර

ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ගේ නිපුණතා, ශාක්‍යතා, දක්ෂතා, සහ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම සහ පර්යේෂණ පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

### 04.අරමුණු

1. ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනාගෙන ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම සඳහා පාඨමාලා නිර්මාණය කිරීම, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.

2. ක්‍රීඩා අධ්‍යාපනයේ සංවර්ධන ප්‍රමිතිකරණය සඳහා අවශ්‍ය විශේෂඥතාව කාලීනව විධිමත් කිරීම හා මෙහෙයවීම.

3. නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය මට්ටමින් ලබාදීම අරමුණු කර ගනිමින් කෙටිකාලීන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් මඟින් නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය ප්‍රදේශ වෙත ගෙනයාම.

### 05.ප්‍රධාන කාර්යයන්

| # | කාර්යය | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|
| 1 | 1. අංක 1973/25 දරණ ක්‍රීඩා පනතේ විධිවිධාන වලට අනුව මෙන්ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ IV, NVQ V, NVQ VI) සඳහා අනුකූල වන පරිදි ක්‍රීඩා පාඨමාලාවන් පැවැත්වීම.<br>• උසස් පුහුණුකරු පාඨමාලාව (NVQ VI)<br>• ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ V)<br>• ශරීර සුවතා උපදේශක පුහුණු පාඨමාලාව (NVQ IV)<br>2. ක්‍රීඩා කළමණාකරනය, ක්‍රීඩා අබාධ කලමණාකරනය ඇතුළු ක්ෂේත්‍ර ආවරණය කරමින් ක්‍රීඩා පාඨමාලා/ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ආරක්ෂක අංශයන්හි ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්, ජාත්‍යන්තර සහ ජාතික මට්ටමෙන් තරඟ කල ක්‍රීඩකයන්, ක්‍රීඩා මාධ්‍යවේදීන්. |
| 2 | ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම | ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවයන්. |

| | | |
|---|---|---|
| 3 | ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම | ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ආයතන. |
| 4 | ශරීර සුවතා වැඩසටහන් පැවැත්වීම | ශරීර සුවතාව හා ඒ පිළිබඳ දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන රාජ්‍ය නිලධාරීන් ඇතුළු මහජනතාව . |
| 5 | ක්‍රීඩා සේවයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු වල පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන්. |
| 6 | ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කුසලතා ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම | සියළුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් පුහුණුකරුවන්. |
| 7 | අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා කාර්යක්ෂමතා කඩඉමක් ලෙස ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම. | අධ්‍යාපන අමාත්‍යාංශයට බඳවා ගත් නවක ක්‍රීඩා පුහුණුකරුවන්. |
| 8 | ත්‍රිවිධ හමුදාවල සහ පොලිසියේ නිළධාරීන් පුහුණුකරනු ලබන ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම | ත්‍රිවිධ හමුදාවේ සහ පොළීසියේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්. |
| 9 | පාසල් ළමුන්ගේ 13 වසරක අධ්‍යාපනය සහතික කිරීම සඳහා පවත්වනු ලබන NVQ IV මට්ටමේ ක්‍රීඩා පාඨමාලාව | උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් නොමැති ක්‍රීඩාව කෙරෙහි දක්ෂතා ඇති පාසල් සිසුන්. |

**06.මානව සම්පත් පැතිකඩ :**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | **07** | 01 | 06 | - |
| තෘතියික | **11** | 03 | 08 | - |
| ද්විතියික | **29** | 19 | 10 | - |
| ප්‍රාථමික | **07** | 04 | 03 | - |
| **එකතුව** | **54** | **27** | **27** | **-** |

**07.සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල (රු.මි.) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **1** | ක්‍රීඩා නව්‍යකරණ ව්‍යාපෘතිය | 19.30 | 17.88 | 93 | 93 |
| **2** | මානව සම්පත් සංවර්ධනය | 0.80 | 0.43 | 55 | 55 |
| **4** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3.70 | 2.89 | 78 | 78 |
| **5** | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.20 | 0.93 | 78 | 78 |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | |
| **6** | ගොඩනැඟිලි හා ඉදිකිරීම | 5.00 | 4.83 | 97 | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **7** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1.00 | 0.34 | 34 | 35 |
| **8** | වාහන | 0.50 | 0 | 0 | 0 |
| | **එකතුව** | **31.50** | **27.30** | **86.67** | **87** |

**08.වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2024.12.31 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | **2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | (රු.මි.) | % |
| පුනරාවර්තන වියදම | 64.00 | 42.5 | 66.40 |
| ප්‍රාග්ධන වියදම | 31.50 | 25.9 | 82.22 |
| **එකතුව** | **95.50** | **68.4** | **71.62** |

**09. 2024 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා විශේෂ ජයග්‍රහන**

1. පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් සහ ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සඳහා විශේෂ ක්‍රීඩා පුහුණු වැඩසටහනක් 2024.05.20දින සිට 22 දින දක්වා පැවැත්වීමට හැකිවිය.





**පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථා**

2. මුහුදු වෙරළ භාවිත කරමින් ක්‍රීඩාවට අවශ්‍ය වන ශක්තිය හා යෝග්‍යතාව දියුණු කර ගැනීම පිළිබඳව පුහුණුකරුවන් වෙත ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීමට හැකි විය. මෙම වැඩසටහන මාතර වෙරළ තීරය භාවිත කරමින් 2024.06.26 දින සිට 2024.06.29 දින දක්වා පවත්වන ලදී.

**පුහුණු වැඩසටහනේ විශේෂ අවස්ථා**





03.ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.05.07 දින ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.



**2024 වර්ෂයේදී පවත්වා ඇති ක්‍රීඩා පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ගණන - 31**
**අධ්‍යාපනය හා දැනුම ලබාදී ඇති ගණන - 1561**

**10.ඉදිරි ඉලක්ක 2025-2028**

1. 2028 වර්ෂයේදී පැවැත්වීමට නියමිත ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ පරිසාධන මට්ටමට ලඟාවිය හැකි ක්‍රීඩා පුහුණුකරනු ලබන පුහුණුකරුවන්ට නව තාක්ෂණික දැනුම ලබාදෙමින් අදාල ඉලක්ක වෙත ලඟාවීමට විදේශ සම්පත්දායකයින් යොදාගනිමින් කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
2. 2026 වර්ෂයේදී ආසියාතික සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල වලදී පදක්කම් ජයග්‍රහනය කල හැකි ක්‍රීඩාවන් ඉලක්ක කර ගනිමින් උසස් පුහුණුකරු පාඨමාලාවන් පැවැත්වීම.
3. ව්‍යායාම් මධ්‍යස්ථානයන්හි පුහුණු උපදේශකයින් සහ ඒ පිළිබඳ උනන්දුවක් ඇති පාසල් හැරගිය තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපලට අවතීර්ණ වීමට හැකි වන පරිදි ව්‍යායාම සහ එම උපකරණ භාවිතය පිළිබඳව නිවැරදි දැනුම ලබාදීම වෙනුවෙන් පුහුණු පාඨමාලා පැවැත්වීම.

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

# 2024

## ප්‍රගති වාර්තාව

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

### 01.හැඳින්වීම

වර්තමානයේ ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් වාණිජකරණය වී තිබේ. ඒ හේතුවෙන් වර්තමාන ක්‍රීඩක ක්‍රීඩකාවන් හුදෙක්ම ජයග්‍රහණය අරමුණු කොටගෙන ක්‍රීඩා කිරීමට යොමු වී තිබේ. මෙහිදී පවතින දැඩි තරගකාරීත්වය නිසාම නීත්‍යානුකූල නොවන ක්‍රමවේද භාවිතා කර හුදු ජයග්‍රහණ ලබා ගැනීමට ඔවුන් පෙළඹී තිබේ.

මේ හේතුවෙන් ක්‍රීඩාවේදී තහනම් ද්‍රව්‍ය හා ක්‍රම කරලියට පැමිණ තිබේ. ජාතික මෙන්ම ජාත්‍යන්තර ක්‍රීඩා තරගවලදී මෙම තහනම් ද්‍රව්‍ය භාවිතය තුළින් ක්‍රීඩාවේ අව්‍යාජ භාවයට හානි සිදුකරනවා සේ ම අවසානයේ රටක් ලෙස ජාත්‍යන්තරය ඉදිරියේ අපකීර්තියට පත් ව රටේ ජවසම්පන්න මතු පරපුර සෞඛ්‍ය අතින් පරිහානියට ද පත් වේ.

ජාත්‍යන්තර මට්ටමෙන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා 1999ට කැනඩාවේ මොන්ට්‍රියෙල් නුවර කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන ලෝක තහනම් උත්තේජක මර්දන ආයතනය අනුගමනය කරමින් 2013 වසර තෙක් ම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ ඒ පිළිබඳව නිරූපණය කිරීම් සිදු කිරීම ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදුවිය.

මෙම විෂය ඉටුකිරීම සඳහා ස්වාධීන ව කටයුතු කරන වෙනම ම ආයතනයක අවශ්‍යතාවය ඒ වන විටත් මතුවෙමින් තිබුන බැවින් 2013 වර්ෂයේ නොවැම්බර් 18 වැනි දින දී 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත" සංස්ථාපනය කෙරුණි. එම පනතේ තුන්වන කොටස යටතේ තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ මුලිනුපුටා දැමීම වන විෂය තේමා කර ගත් ශ්‍රී ලාංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බිහි කරනු ලැබීය.

දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රමුඛ පරමාර්ථය වනුයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමයි.

### 02.දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක් උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

### 03.මෙහෙවර

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ එහි රෙගුලාසිවලට අනුකූල වන ආකාරයට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම

### 04. අරමුණු

ශ්‍රී ලංකාවේ ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල ව කටයුතු කිරීමට සහය දැක්වීම.

**ද්විතික අරමුණු**

- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජයට, ක්‍රීඩා අමාත්‍යංශය සහ ජාතික ඔලිම්පික් කමිටුව දැනුවත් කිරීම.
- 2021 ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ වීම.
- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල වීම සඳහා සියලුම ක්‍රීඩා සමාගම්/ ආයතනවලට සහයෝගය ලබා දීම.
- වාණිජමය පදනමින් අදාළ වන ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කලාපීය තහනම් උත්තේජක මර්දන ආයතන ඇතුළු ව අනෙකුත් තහනම් උත්තේජක මර්දන ආයතන සමග යාවත්කාලීන වූ තහනම් උත්තේජක මර්දන භාවිතයන් සහ විශේෂඥ දැනුම බෙදා ගැනීම.
- WADA සහ NADO ඇතුළු බලගතු උත්තේජක මර්දන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ජාතික වැදගත්කමක් ඇති ඉහළ මට්ටමේ ක්‍රීඩා ඉසව් සඳහා විශේෂඥ තහනම් උත්තේජක මර්දනය සම්බන්ධ උපදෙස් සහ මගපෙන්වීම ලබා දීම.
- සියලු ම ප්‍රධාන ඉසව් සම්බන්ධ වගකීම් ලෝක මට්ටමේ ප්‍රමිතියට අනුව ඉටු කිරීම.
- තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ වැඩසටහනක් ලබා දීම.
- අභ්‍යන්තර හා බාහිර ව විශේෂඥයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයේ අවදානම අඛණ්ඩව ඇගයීමට ලක් කිරීම.
- නීතිය බලාත්මක කිරීම ඇතුළු ව පවතින කදවුරු තුළින් බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ නිපුණතා වැඩි කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ අධ්‍යාපනික දර්ශනය හරහා අධ්‍යාපන වැඩසටහන් හරහා වැළැක්වීම මත පදනම් වූ සාරධර්ම ශක්තිමත් කිරීම, ඉතා සුදුසු ප්‍රායෝගික මෙවලම් සහ උපකාරක සේවා වර්ධනය මගින් සහාය වීම.
- බුද්ධි තොරතුරු ප්‍රමුඛ, ජවසම්පන්න සහ ප්‍රතිග්‍රාහක පරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- තහනම් උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම දැඩි ලෙස විමර්ශනය කර නඩු පැවරීම.
- ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් යොදා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඒකාකාර ක්‍රීඩා පිටියක් ප්‍රවර්ධනය කිරීම.

**05.ප්‍රධාන කාර්යයන්**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රධාන ශ්‍රීතික කාර්යයන් ලෙස,

- තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම.
  ක්‍රීඩාවේදී ක්‍රීඩකයන්ගේ මූත්‍රා හෝ රුධිර සාම්පල යොදා ගනිමින් තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කෙරේ. එය තරගාවලිය තුළදී හා තරග වලින් පිටදී යන දෙයාකාරයෙන්ම පරීක්ෂණ සිදු කරනු ලබයි. මෙලෙස ලබාගන්නා සාම්පල ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් නිර්දේශිත විදේශීය පර්යේෂණාගාරවලට යොමු කර ප්‍රතිඵල ලබා ගනී. මෙහිදි තහනම් උත්තේජක ගත්බව සනාථ වුවහොත් අදාළ නීතිමය පියවර ගෙන දඬුවම් ලබාදීම වැනි කටයුතු සිදු කෙරේ.

- දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම.
  ක්‍රීඩාවේදි මෙම තහනම් උත්තේජක පිටුදැකීම තවමත් ශ්‍රී ලංකාවට නව මාතෘකාවකි. එබැවින් ක්‍රීඩාව හා උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්,

පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමව්පියන් ඇතුළු අනෙකුත් ක්‍රීඩාව සම්බන්ධ උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන් දැනුවත් කිරීම් සිදු කෙරේ.

- තහනම් උත්තේජක පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.
  ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල තවමත් දේශිය වෛද්‍ය ක්‍රමවේද, ආයුර්වේද වෛද්‍ය ක්‍රම, දේශීය ආහාරපාන භාවිතය දක්නට ලැබේ. මෙහිදී මෙම ඖෂධ හා ආහාරපානවල එම සංඝටක අඩංගුද කියා සොයා බලා ඒවාහි අඩංගුතාවය පරීක්ෂා කර පර්යේෂණ ලිපි සකස් කර ජාත්‍යන්තරය සමඟ එම දැනුම හුවමාරු කරගනිමින් කටයුතු සිදු කෙරේ.

## 06. මානව සම්පත් පැතිකඩ

කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජන මර්දන නියෝජ්‍යායතනය වෙත 29 දෙනෙකු සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

සේවක මණ්ඩලය සම්පූර්ණ කිරීමට 11 දෙනෙකු බඳවා ගැනීම සිදු කළ යුතුය.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | වැඩ බලන පදනම මත | ඇබෑර්තු | අතිරික්තය |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 10 | 7 | 1 | 2 | 2 |
| තෘතියික | 3 | 1 | | 2 | 2 |
| ද්විතියික | 9 | 4 | | 5 | 5 |
| ප්‍රාථමික | 7 | 5 | | 2 | 2 |
| **එකතුව** | **29** | **17** | **1** | **11** | **11** |

## 07.සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහනේ නම | | වෙන්කළ මුදල (මිලි.රු) | 2024.12.31 ට මූල්‍ය ප්‍රගතිය (මිලි.රු) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| 01 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | | 4.5 | 1.47 | 33 | 42 |
| 02 | ප්‍රාග්ධන උපකරණ අත්පත් කරගැනීම | ගොඩනැඟිලි හා ඉදිකිරීම් | 6.00 | 2.7 | | 50 |
| | | පුහුණු කිරීමේ උපකරන හා අනෙකුත් උපකරණ ලබා ගැනීම | 1.20 | 1.2 | 100 | 100 |
| | | පර්යේෂණාගාර උපකරන ලබා ගැනීම | 1.55 | 1.55 | 100 | 100 |
| 03 | ධාරිතා සංවර්ධනය | | 1.20 | 0.32 | 27 | 86 |
| 04 | තහනම් උත්තේජක පරීක්ෂණ | | 18.00 | 16.41 | 91 | 90 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | තහනම් උත්තේජක සම්බන්ධ අධ්‍යාපනය | 1.05 | 0.87 | 83 | 97 |
| 06 | බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1.50 | 1.44 | 96 | 90 |
| 07 | පර්යේෂණ හා සංවර්ධන | 14.00 | 9.60 | 69 | 80 |
| 08 | සූර්ය පැනල ස්ථාපිත කිරීම | 15.00 | 0.02 | 0.1 | 45 |
| | **එකතුව** | **64.00** | **35.62** | **56** | |

**08.**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය **2024.12.31** දිනට

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාද (රු.මි) | **2024.12.31** දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | **(රු.මි)** | **(%)** |
| පුනරාවර්තන වියදම | 67.1 | 50.3 | 74.96 |
| ප්‍රාග්ධන වියදම | 64.00 | 36.0 | 56.25 |
| එකතුව | **131.1** | **86.3** | **65.82** |

**09. 2024 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා විශේෂ ජයග්‍රහන**

**ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**





**තහනම් ද්‍රව්‍ය රට තුළ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පොලිස් නිලධාරීන්ගේ කාර්ය සහ නීති ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම.**



**සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උත්සව වලදී සහ අනෙකුත් ක්‍රීඩා උත්සවයන් වලදී ක්‍රීඩකයින් සහ දෙමාපියන් ප්‍රදර්ශන කුටි මඟින් දැන්වත් කිරීම**





**පර්යේෂණ අංශය විසින් විශ්ව විද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කොට පරීක්ෂණ පැවැත්වීම.**





## 10. ඉදිරි ඉලක්ක 2025-2028

- 2028 වන විට ආසියානු කලාපයේ තහනම් උත්තේජක ක්ෂේත්‍රයේ වඩාත්ම වෘත්තීය සහ තිරසාර සංවිධානය බවට පත්වීම සඳහා අන්තර් සහයෝගීතා සැලැස්ම, නීතිමය රාමුව ශක්තිමත් කිරීම, අන්තර් ආයතනික සහයෝගීතාවය සහ ස්වයං ඔරොත්තු දීමේ හැකියාව සංවර්ධනය කිරීම.
- 2028 වන විට තහනම් උත්තේජක විරෝධී ක්‍රියාවලිය පිළිබඳව සියලුම ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම සඳහා නව මෙවලම් සමඟින් සකස් කළ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම, ක්‍රියාත්මක කිරීම, සහ තහනම් උත්තේජක හැසිරවීම් වාර්තා කිරීම සහතික කිරීම
- 2028 වන විට තහනම් උත්තේජක ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්විමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය බවට පත්වීම සඳහා  උත්තේජක භාවිතය පිළිබඳ සමාජ හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම, සම්බන්ධීකරණය සහ බෙදා හැරීමේ කටයුතු විධිමත් කිරීම.
- නවතම ICT මෙවලම භාවිතය තුළින් 2026 වන විට තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
- තහනම් උත්තේජක පරීක්ෂණ පැවැත්වීමත්, අභ්‍යන්තර ප්‍රතිඵල කළමනාකරණය ශක්තිමත් කිරීමත් තුළින් 2028 වන විට තහනම් උත්තේජක නීති උල්ලංඝණය කිරීම
- ( ADRVs) අවම කිරීම.
- 2028 වන විට නීති විරෝධී උත්තේජක ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා නීත්‍යානුකූල කේන්ද්‍රස්ථානය බවට පත්වීම සඳහා තහනම් උත්තේජක භාවිතයේදී නීතිය ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම.

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# 2024

## ප්‍රගති වාර්තාව

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

### 01.හැඳින්වීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වෙනි දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත් කිරීමේ 1999 අංක 17 දරන පනත හා 2017 අගෝස්තු මස 28 දිනැති 2017 අංක 14 දරන (සංශෝධන) පනත ප්‍රකාරව පාලනය කරනු ලැබේ.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම ක්‍රීඩා සංකීර්ණය වන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය තුල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ක්‍රීඩා යටිතල පහසුකම් සලසනු ලැබේ. එමෙන්ම ආසන 5,000 ක ධාරිතාවකින් යුත් වායු සමීකරණය කරන ලද දිවයින තුල පිහිටි විශාලතම ගෘහස්ථ ක්‍රීඩාංගණය මෙම ක්‍රීඩා සංකීර්ණය තුල පිහිටා ඇත. මෙම ආයතනය විසින් ජාතික ක්‍රීඩා ආයතන, ජාතික ක්‍රීඩා සමාජ, ක්‍රීඩා සමාජ සහ පාසල් වල ක්‍රීඩා ඉසව්වලට පමණක් නොව ත්‍රිවිධ හමුදාව, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, විශ්ව විද්‍යාල, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා හා ක්‍රීඩා නොවන විවිධ වැඩ සටහන් සඳහා අවශ්‍ය පහසුකම් සඳහා භාවිතා කරනු ලබයි.

### 02.දැක්ම

දකුණු ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායිව ලබාදීම.

### 03.මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ කුසලතා ඔප් නැංවීමට ඇවැසි පහසුකම් සහිත ආසියානු කලාපයේ ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.

### 04.අරමුණු

- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම.
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා හා විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ පහසුකම් වැඩිදියුණු කිරීම, ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීම.
- මෙරට ක්‍රීඩාවේ උන්නතිය උදෙසා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම් සැලසීම.
- සමාජ සමගිය සහ ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීමේ යාන්ත්‍රණයන් ලෙස ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් භාවිතා කිරීම සහතික කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය, නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම ක්‍රීඩා ආයතන සමඟ සම්බන්ධීකරණය සහ ක්‍රීඩාව වෙනුවෙන් සහනදායී මිලට පහසුකම් සැපයීම යන වගකීම් දැරීම සඳහා අධිකාරිය විසින් පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරන ලද අතර ක්‍රීඩා සමාජ, පාසල් ක්‍රීඩා සමාජ සහ රාජ්‍යය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද සහනදායී මිල ගණන් යටතේ සේවාවන් සහ පහසුකම් සපයනු ලැබේ.

- ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලීන් නියෝජනය සඳහා අවශ්‍ය ධාවන හා පිටිය ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- දිවා සහ රාත්‍රී කාලයේ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිතව තරඟ පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- අඩු පහසුකම් සහිත පාසල්වල සහ ග්‍රාමීය මට්ටමින් දක්ෂතා වලින් සන්නද්ධ ක්‍රීඩක ක්‍රීඩිකාවන් / ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම් සපයමින් ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පිහිනුම් තරඟ පැවැත්වීම සඳහා අවශ්‍ය පිහිනුම් හා කිමිදුම් තටාක පහසුකම් සැපයීම.
- ක්‍රීඩා නොවන ඉසව් වන විභාග, සම්මන්ත්‍රණ, සම්මේලන, උත්සව සහ විනෝදාත්මක කටයුතු පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- පුහුණු කටයුතු පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම.

## 05. මානව සම්පත් පැතිකඩ

| අනුමත සේවක සංඛ්‍යාව | | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 11 | 4 | 7 | 0 |
| තෘතියික | 11 | 9 | 2 | 0 |
| ද්විතියික | 74 | 49 | 25 | 0 |
| ප්‍රාථමික | 281 | 186 | 95 | 0 |
| **එකතුව** | **377** | **248** | **129** | **0** |

## 06.සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අ අ | වැඩසටහනේ නම | වෙන්කල මුදල (රු.මි.) | 2024.12.31 ට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **1** | එළිමහන් ක්‍රීඩාංගණයේ මාධ්‍ය ගොඩනැගිල්ල හා ප්‍රේක්ෂකාගාරයේ වහල නවීකරණය කිරීම | 54 | 20.24 | 37% | 45% |
| **2** | ගෘහස්ථ ක්‍රීඩාංගණය නවීකරණය | 37 | 9.37 | 6.2 | 22% |
| **3** | පිහිණුම් තටාක ප්‍රේක්ෂකාගාරයේ පුටු අලුතින් මිලදී ගෙන සවිකිරීම (අදියර 1). | 13.7 | 12.74 | 93% | 100% |
| **4** | පිහිණුම් තටාක ප්‍රේක්ෂකාගාරයේ පුටු අලුතින් මිලදී ගෙන සවිකිරීම (අදියර 2) | 18 | - | - | 12% |
| **5** | එළිමහන් ක්‍රීඩාංගණය සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීම | 9.3 | - | - | 7% |
| **6** | බෝගම්බර ක්‍රීඩාංගණයේ රථ ගාල නවීකරණය | 18 | 16.24 | 90.22% | 100% |
| **7** | බෝගම්බර ක්‍රීඩාංගණය නවීකරණය | 28 | - | - | 12% |
| **8** | එළිමහන් ක්‍රීඩාංගණය වටා ඇති වැට අලුත්වැඩියාව | 18 | - | - | 20% |

| | | | | | |
|---|---|---|---|---|---|
| **9** | ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ගිනි නිවීමේ පද්ධතිය නවීකරණය | 14.5 | 12.64 | 87.17 | 95% |
| **10** | CCTV කැමරා පද්ධතිය නවීකරණය කිරීම | 2 | 0.29 | 14.5% | 2% |
| **11** | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම | 9.5 | - | - | 12% |
| **12** | දුනු ශිල්ප පරාසය ඉදිකිරීම | 2.0 | - | - | 0% |
| **13** | ක්‍රීඩා හෝටලයේ මුලුතැන්ගෙය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | 9.5 | - | - | 3% |
| **14** | ගෘහස්ත ක්‍රීඩාංගනයේ සිවිලිම අලුත්වැඩියා කිරීම ( Sub Arena) | 9.5 | - | - | 1% |
| **15** | අවිච්ඡේද ව්‍යාපෘති | 84 | 77.61 | 93% | 90% |

**07.වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය 2024.12.31 දිනට**

| **විස්තරය** | **වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)** | **2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **(රු.මි.)** | **%** |
| පුනරාවර්තන වියදම | 487.3 | 174.66 | 37.56 |
| ප්‍රාග්ධන වියදම | 320.00 | 149.2 | 46.6 |
| **එකතුව** | **807.73** | **323.79** | **40.09** |

**08.2024 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා ජයග්‍රහණ**

1. 2024.09.30 දිනට අධිකාරියේ ක්‍රීඩා හා ක්‍රීඩා නොවන ඉසව් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම තුලින් රු. **මි. 244.86** ක ආදායමක් උපයා ඇත.

2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ක්‍රීඩා අංශය මගින් උතුරු කොළඹ පාසල් වල ඉගෙනුම ලබන දරුවන්ගේ පිහිණුම් දක්ෂතා හඳුනා ගැනීමේ වැඩසටහනක් 2024.05.28 දින පවත්වන ලද අතර, ඒ සඳහා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300ක් සහභාගී විය. මලල ක්‍රීඩා, අත්පන්දු, පාපන්දු, දැල්පන්දු සහ පිහිණුම් ක්‍රීඩාවන් සඳහා ප්‍රවීණ පුහුණුකරුවන්ගේ සහභාගිත්වයෙන් මෙම වැඩසටහන පවත්වන ලදී.







3. පිහිණුම් තටාකයේ ජල පිරිපහදු කිරීමේ පද්ධතිය සහ පොම්පාගාරය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර එමගින් පිහිනුම් තටාක සඳහා දැනට මසකට වැයවන ජල ඒකක 500 ක් සඳහා වැයවන මුදල ඉතිරි වන අතර පිහිණුම් තටාක ජල ධාරිතාවය වන ජලය ලීටර් ලක්ෂ 34ක් දෛනිකව පිරිපහදු කර නැවත භාවිතා කල හැකි වේ. මේ නිසා ව්‍යාපෘතිය නිම වීමෙන් පසු පිහිණුම් තටාක වලට ජලය සැපයීම වෙනුවෙන් අධිකාරිය විසින් දරනු ලබන වැය බර ඉතිරි කල හැකි වනු ඇත. ( ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 49.19)







## 07. ඉදිරි ඉලක්ක 2025 – 2028

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ක්‍රීඩා සංකීර්ණයක් වන බැවින් ක්‍රීඩාවේ අභිවෘද්ධිය සහ එම කටයුතු කෙරෙහි සහය ලබාදීමේ පරිපාලනමය කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් ඉදිරි වසර කිහිපය තුළ පහත සඳහන් ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට නියමිතය.

1. නවීන ක්‍රීඩා පහසුකම් ලබාදීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම.
2. පුහුණුවීම් සහ ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම/ නඩත්තු කිරීම.
3. පරිශ්‍රය තුල ඇති ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතය / භාවිතා කරන්නන් සංඛ්‍යාව ඉහල නැංවීම සහ යහපත් ක්‍රීඩා සංස්කෘතියක් ස්ථාපිත කිරීමට දිරිමත් කිරීම.
4. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගුණාත්මක සේවාවක් සැපයීම සහ පුහුණුවන්නන් සඳහා සුදුසුකම් ලත් උපදේශකයින් / පුහුණුකරුවන් සම්බන්ධ කර දීම.
5. අධිකාරිය සතු ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයෙන් තවදුරටත් ආදායම වර්ධනය කර ගැනීම එමගින් රජය විසින් ආයතනය වෙනුවෙන් දරනු ලබන වැය බර අවම කිරීම.
6. ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩා පිටි කළමනාකරණය / පිහිනුම් තටාක කළමනාකරණය / ක්‍රීඩා පහසුකම් ලබා දීම සඳහා බාහිර ආයතන වලට තාක්ෂණික පුහුණුව ලබා දීම.
7. දිවයිනේ පාසල්, සමාජ ශාලා සහ ක්‍රීඩා සංකීර්ණවල ක්‍රීඩා පහසුකම් කළමනාකරණය කිරීම සඳහා උපදේශන සහ තාක්ෂණික සහාය ලබා දීම.
8. ක්‍රීඩා යටිතල පහසුකම් හා ආයතන පරිශ්‍රය තුල ඇති අලෙවි ආදායම් ඉහල නැංවීම තුලින් 2026 වසර අවසන් වන විට ආදායම් වියදම් සමතුලිත මට්ටමට ළඟා වීම.

# ක්‍රීඩා වෛද්‍ය ආයතනය

# 2024

## ප්‍රගති වාර්තාව

## ක්‍රීඩා වෛද්‍ය ආයතනය

### 01. හැඳින්වීම

ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික නිරෝගී බව පවත්වාගෙන යාම, ඔවුන්ගේ රෝග නිවාරණයආබාධ කළමනාකරණය ,, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රිඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ සිදු කරමින් මෙරට ක්‍රීඩාව දියුණු කිරීම යන අරමුණු ඇතිව ක්‍රීඩා වෛද්‍ය ආයතනය ස්ථාපනය කර ඇත. පාසල් මට්ටමේ සිට ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා පවත්වනු ලබන සියළු ක්‍රීඩා තරගාවලින් සඳහා වෛද්‍ය ආවරණ සැපයීමත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ක්‍රීඩාවට අදාල සියළු වෛද්‍ය පහසුකම් ලබා දීමත් මේ තුලින් සිදු වේ.

හදිසි ප්‍රතිකාර අංශය හා බාහිර රෝගී අංශය, පුනරුත්ථාපන අංශය, කායික යෝග්‍යතා අංශය, ජෛව යාන්ත්‍රණ හා පර්යේෂණ සහ සංවර්ධන යන අංශ එක්ව සේවා පවත්වා ගෙන යන අතර ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ක්‍රීඩා වෛද්‍ය විද්‍යා පර්යේෂණ සිදු කිරීම හා ලොව දියුණු රටවල භාවිත වන නවීන ක්‍රීඩා තාක්ෂණය මෙරට තුළ යොදා ගැනීමෙන් ක්‍රීඩාවේ ජාත්‍යන්තර ජයග්‍රහණ අත්කර ගැනීමට උපරිම දායකත්වයක් ලබාදිමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය කටයුතු කරයි. තවද මානව කාර්ය සාධන විද්‍යාගාරය ස්ථාපනය කර ඇති අතර එහි ජෛව යාන්ත්‍රණ අංශය සම්පූර්ණ විමත් සමඟම මෙරට ක්‍රීඩාවේ උන්නතිය සඳහා අංග සම්පූර්ණ මානව කාර්ය සාධන විද්‍යාගාරයක පහසුකම් ද ක්‍රීඩකයින් වෙත ලබා දීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනයට හැකිවනු ඇත.

### 02. දැක්ම

ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය විද්‍යාව තුළින් පරිපූර්ණ සෞඛ්‍ය සේවාවක් ලබාදීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛයා වීම.

### 03. මෙහෙවර

ක්‍රිඩා හා ව්‍යායාම විද්‍යාව, සායනික, පර්යේෂණ, අධ්‍යාපන යන අංශ ඔස්සේ සාකල්‍ය ප්‍රවේශයක් මඟින් ලබා දී සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකාවේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය ලෙස සංවර්ධනය කිරීම.

### 04. අරමුණු

1. සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍ය හා කායික යෝග්‍යතාව ඉහළ නැංවීම තුළින් ඔවුන් ජාත්‍යන්තරය තුළ ක්‍රීඩාවෙන් ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒම.
2. ක්‍රීඩා විද්‍යාව හා නවීන තාක්ෂණය උපයෝගි කරගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඔවුන් විසින්ම උරුම කරගනු ලැබූ හැකියාවන් වර්ධනය කිරීම සඳහා මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කර ඉන් උපරිම ප්‍රතිඵල මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබාදීම .
3. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පූර්ව සහභාගිත්ව වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම තුළින් ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.
4. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාව හා පෝෂණ මට්ටම වරින්වර මැන බැලීම, කායික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හා පෝෂණ සටහන් ලබා දීම තුළින් කායික යෝග්‍යතාවය සහ පෝෂණය වැඩිදියුණු කිරීම.
5. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය කරමින් ක්‍රීඩාවට උචිත ජයග්‍රාහී මානසික තත්ත්වයක් ළඟා කරදීමට උපදේශන හා මඟ පෙන්වීම .
6. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම ක්‍රීඩාවට උචිත පරිදි ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම .
7. ක්‍රීඩාවේදී අවශ්‍ය ප්‍රථමාධාර භාවිතය පිළිබඳව පුහුණුකරුවන් හා වෛද්‍ය සහායකයන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. දේශිය හා විදේශිය වශයෙන් පවත්වනු ලබන තරගාවලි සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රථමාධාර හා වෛද්‍ය ආවරණ සැපයීම.

9. ක්‍රීඩා විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ දෙස් විදෙස් විද්වතුන් සමඟ පර්යේෂණ පැවැත්වීම හා ඒ තුළින් ලබා ගන්නා දැනුමෙන් මෙරට ක්‍රීඩාව උසස් මට්ටමකට ගෙන ඒම.
10. ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයට ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ දැනුම හා මාර්ගෝපදේශ ලබාදීම තුළින් නිරෝගී ප්‍රජාවක් බිහි කිරීම සඳහා දායක වීම.

## 05.ප්‍රධාන කාර්යයන්

- ක්‍රීඩා ආබාධ වැළැක්වීම සහ කළමණාකරණය කිරිම සඳහා කටයුතු කිරීම
- විශේෂඥ වෛද්‍ය සායන පැවැත්වීම
- කායික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම
- මානව කාර්ය සාධන විද්‍යාගාරය මඟින් ක්‍රීඩකයින්ගේ ජෛව තාක්ෂණය සම්බන්ධව සහ, හෘදය සහ පෙනහළුවල දරා ගැනීමේ හැකියාව සම්බන්ධව සහ පරීක්ෂණ සහ පර්යේෂණ කිරීම.
- ක්‍රීඩා පෝෂණ හා ක්‍රීඩා මානසික උපදේශණය
- ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි සඳහා වෛද්‍ය හා ප්‍රථමාධාර ආවරණය
- ක්‍රීඩා අධ්‍යාපනය හා පර්යේෂණ සිදු කිරීම
- විනෝදාත්මක ක්‍රීඩා සඳහා යොමු වූ පුද්ගලයින් සඳහා ක්‍රීඩා හා ව්‍යායාම සම්බන්ධව උපදෙස් සහ වෛද්‍ය පහසුකම් ලබාදීම.
- දෙස් විදෙස් විද්වතුන් හා ආයතන සමඟ ක්‍රීඩාව හා පෝෂණය සම්බන්ධ පර්යේෂණ වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම.

## 06.මානව සම්පත් පැතිකඩ

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු (අතිරික්ත) |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 10 | 06 | 04 |
| **තෘතීයික** | 05 | 03 | 02 |
| **ද්විතියික** | 20 | 17 | 03 |
| **ප්‍රාථමික** | 41 | 37 | 04 |
| **එකතුව** | **76** | **63** | **13** |

## 07. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහනේ නම | වෙන්කළ මුදල(.මි.රු) | 202412.31.ට මූල්‍ය ප්‍රගතිය (.මි.රු) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **1** | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2.00 | 1.90 | 95 | 10045 |
| **2** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සංවර්ධනය | 1.00 | 1.00 | 100 | 100 |
| **3** | වාහන - වැඩිදියුණු කිරිම | 1.00 | 0.74 | 74 | 80 |
| **4** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම | 1.00 | 0.42 | 42 | 90 |
| **5** | මානව සම්පත් සංවර්ධනය - කාර්ය මණ්ඩල පුහුණු | 1.00 | 0.43 | 43 | 70 |
| **6** | පර්යේෂණ හා සංවර්ධන | 10.00 | 0.47 | 5 | 40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **7** | වෙනත් -<br>ඉහල දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය | 4.00 | 1.33 | 33 | 100 |
| **8** | වෙනත් -<br>ක්‍රීඩා පාසල් හා ක්‍රීඩා දක්ෂතා සහිත අනෙකුත් පාසල් සඳහා ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත් කිරිමේ ව්‍යාපෘතිය | 3.00 | 0.60 | 20 | 60 |
| **9** | වෙනත් -<br>පුහුණුකරුවන් පුහුණු කිරිමේ ව්‍යාපෘතිය | 5.00 | 0.31 | 6 | 60 |
| **10** | වෙනත් -<br>ආයතනයේ වෙබ් පිටුව සැකසීම හා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සැකසීම (2023- බිල්පත් පියවීම ) | 1.00 | 0.85 | 85 | 80 |
| **11** | ගොඩනැගිලි හා ඉදිකිරීම් - ආයතනය සඳහා CCTV, ඇතුළු වෙනත් පද්ධතින් ස්ථාපනය කිරීම | 2.00 | 1.79 | 90 | 100 |
| | | **31.00** | **9.85** | **32** | **60** |

**08.වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 2024.12.31 දිනට**

| විස්තරය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රු.මි.) | % |
| පුනරාවර්ථන වියදම | 136.2 | 116.4 | 85.46 |
| ප්‍රාග්ධන වියදම | 31.00 | 9.85 | 31.61 |
| **එකතුව** | **167.2** | **126.25** | **75.50** |

**09. 2024 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා විශේෂ ජයග්‍රහන**

- ඉහල දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය

මෙරට තුල හඳුනාගත් ඉහල කාර්යසාධනයක් සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ ගැටළු නිසියාකාරව හඳුනාගැනීමත් ඒවාට පිළියම් යෙදීමත් තුළින් ඔවුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කරමින් ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණයන් සඳහා යොමුවීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉහල කාර්යසාධනය සඳහා අවශ්‍ය පෝෂණ තත්වය පවත්වා ගැනීමට ක්‍රියා කිරීම සඳහා ඒ සම්බන්ධව ප්‍රමාණික දැනුම ඇති විශ්ව විද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් යුත් කමිටුවක සහාය ඇතිව ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ පෝෂණ තත්වය මැනබැලීම, ඉහල කාර්යසාධන තත්වයන්වල සිටින ක්‍රිඩක ක්‍රිඩිකාවන් සඳහා පෝෂණ උපදෙස් , හා පෝෂණ ගැටළු හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිකර්ම ක්‍රියාවට නැංවීම මේ තුළින් සිදුවේ.









- **ක්‍රීඩා පාසල් හා ක්‍රීඩා දක්ෂතා සහිත අනෙකුත් පාසල් සඳහා ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය**

පාසල් ක්‍රීඩකයින්ගේ පෝෂණ තත්ත්වය හා පෝෂණය සම්බන්ධ දැනුම පරීක්ෂා කිරීම සහ ඔවුන්හට පෝෂණීය ආහාර වේලක් ලබා දීම සහ ඒ සම්බන්ධ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ක්‍රීඩා වෛද්‍ය ආයතනය හා ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍ය සංගමය එක්ව පළාත් නවය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

පාසල් වෙත ගොස් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මූලික පෝෂණ විශ්ලේෂණයන් සිදු කර ආහාර සම්බන්ධ ගැටළු නිරාකරණය කරදීම, ක්‍රීඩකයන්ට ආහාර සපයනු ලබන පාසල් වල උචිත පරිදි ආහාර වට්ටෝරු සංශෝධනය කර ලබා දීම, මූලික වෛද්‍ය පරීක්ෂණයට බඳුන් කර ඔවුන්ගේ ක්‍රීඩා ආබාධ හඳුනා ගැනීම, එම මොහොතේ ලබාදියහැකි වෛද්‍ය උපදෙස් ලබාදීම සහ විශේෂ වෛද්‍ය පරීක්ෂණ හෝ ප්‍රතිකාර කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රාදේශීය රෝහල් වෙත යොමු කිරීම මෙහිදී සිදු වේ. ඒ අනුව මේ වන විට උතුරු මැද පළාතේ හා බස්නාහිර පළාතේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර ඉතිරි පළාත් වෙත යාමට කටයුතු කරමින් සිටී.

**හේනේගම මධ්‍ය මහා විද්‍යාලය** | **හොරණ තක්ෂිලා මහා විද්‍යාලය**





**පොළොන්නරුව රාජකීය විද්‍යාලය** | **රඹෑව මහා විද්‍යාලය**





- **පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන**

පළාත් මට්ටමින් පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම, නූතන තාක්ෂණික දැනුම ඔවුන්ට අත්පත්කර ගැනීමට අවකාශය සැලසීම, නිවැරදි තාක්ෂණික දැනුම ලබා දීම, අඩු වියදම් තාක්ෂණික උපකරණ සහ ශාරීරික බර උපයෝගීකර ගනිමින් ශක්තිවර්ධනය සහ ශාරීරික යෝග්‍යතාවට සම්බන්ධ දැනුම වැඩි කිරිම සඳහා නූතන තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ දැනුවත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මෙහිදී  ක්‍රීඩාවේ ආබාධ අඩුකර ගැනීම, ආබාධ කළමනාකරණය කර ගැනීම සහ දක්ෂතා වර්ධනයට අවශ්‍ය තාක්ෂණික උපදෙස් සැපයීම සිදු කරන අතර පළාත් නවය සඳහා ම ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩසටහන් ක්‍රියාත්මක වේ.

**උතුරු මැද පළාත**





- **මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීම**

මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තරය ජය ගැනීමට යාමේදී ක්‍රීඩා විද්‍යාව, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, නූතන තාක්ෂණය හා යාන්ත්‍රණ විද්‍යාව භාවිතයෙන් දියුණු වූ රටවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ තරඟ වැදීමට සිදුවේ. එහිදී එය ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඌන උපයෝගීතාවක් ලෙස මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත අහිතකරව බලපායි. එම ශිල්ප භාවිතා නොකිරීම මෙන්ම පුහුණුව සඳහා නූතන තාක්ෂණික ක්‍රම, නූතන තාක්ෂණික යන්ත්‍ර උපයෝගී කර නොගැනීම, ක්‍රීඩාවේ අනතුරු වලක්වා ගැනීමට අවස්ථාවත් නොමැති වීම හා ප්‍රනරුත්ථාපනයෙන් පසු කඩිනමින් ක්‍රීඩාව සඳහා යොමු වීමට ඇති හැකියාව අහිමි වීම ද මෙරට ක්‍රීඩාවට අහිතකරව බලපා ඇත.

මෙවන් තත්ත්වයක් තුළ අංග සම්පූර්ණ මානව කාර්ය සාධන විද්‍යාගාරයක් අප රටේ ස්ථාපිත කර ඉහත අහිතකර තත්වයන් ඉවත්කර ගැනීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය කටයුතු කරගෙන යයි.






- **ජාතික හා ජාත්‍යන්තර තරඟාවලී සඳහා වෛද්‍ය ආවරණය සැපයීම.**

ජාතික මහා ක්‍රීඩා උලෙල ඇතුළු ප්‍රධාන ක්‍රීඩා තරඟාවලී සඳහා (ජාතික හෝ ජාත්‍යන්තර) වෛද්‍ය ආවරණ සැපයීම ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ප්‍රධානතම සේවාවක් වේ. මේ වසරේ ද මේ වන විට ජාතික මට්ටමේ තරඟාවලීන් 166 ක් හා ජාත්‍යන්තර තරඟාවලී 28 ක් පමණ ආවරණය කර ඇත. වෛද්‍ය, හෙද, භෞතචිකිත්සක හා සම්බාහක ඇතුළු පූර්ණ ප්‍රථමාධාර කණ්ඩායමක් විසින් මෙම සියළු වෛද්‍ය ආවරණයන් සපයනු ලබයි.










- ආයතනය වෙත පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා හදිසි ප්‍රතිකාර හා බාහිර රෝගී ප්‍රතිකාර, රසායනාගාර පරීක්ෂණ, භෞත චිකිත්සක හා සම්බාහක ප්‍රතිකාර, ක්‍රීඩා පෝෂණ හා ක්‍රීඩා මානසික උපදේශනය ඇතුළු සේවාවන් රාශියක් සපයනු ලබයි.

ඒ අනුව මෙම වසරේද පහත පරිදි සේවාවන් සපයා ඇත.

| හදිසි ප්‍රතිකාර හා බාහිර රෝගී අංශය | රසායනාගාර අංශය | පුනරුත්ථාපන අංශය | | ක්‍රීඩා පෝෂණ ය | කායික යෝග්‍යතා පරීක්ෂණය | වෛද්‍ය ආවරණ | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞත චිකිත්සක | සම්බාහක | | | දේශීය | විදේශීය |
| 8626 | 629 | 4552 | 3946 | 1917 | 1048 | 166 | 28 |

## 10. ඉදිරි ඉලක්ක 2025-2028

- මානව කාර්ය සාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීමෙන් එහි සියළු පහසුකම් මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබාදීම හා භෞත චිකිත්සක අංශය සඳහා සපයා ගන්නා පුනරුත්ථාපන හා ජෛව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් ක්‍රීඩාවේ නවීන තාක්ෂණය මෙරට ක්‍රීඩාව නගා සිටුවීම සඳහා යොදා ගැනීම.

- ක්‍රීඩකයින් වෙහෙසකර ව්‍යායාමවලින් පසු හැකි ඉක්මනින් යථාත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රීඩා වෛද්‍ය ආයතනය තුල රිකවරි ඒකකයක් හා හයිඩ්‍රොතෙරපි ඒකකයක් ස්ථාපනය කිරීම.

- වයඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා පෝෂණ වේදීන්ගේ සංගමය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කරගෙන මේ වන විටත් කටයුතු කරමින් සිටින අතර පේරාදෙණිය, මොරටුව හ ජයවර්ධනපුර විශ්ව විද්‍යාල හා ජයවර්ධනපුර රෝහල ඇතුළු ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල විද්වතුන්ගෙන් යුත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම තුළින් ක්‍රීඩා හා ව්‍යායාම සම්බන්ධව පර්යේෂණ කිරීම, දැනුම හුවමාරු කර ගැනීම හා අනාගතයේදී මෙරට ක්‍රීඩාව දියුණු කිරීම.

- ක්‍රීඩා සම්භාහක පාඨමාලාව NVQ 4 මට්ටම සිට NVQ 5 දක්වා යාවත්කාලීන කිරිම හා ක්‍රීඩා සම්බාහකයින් පුහුණු කිරීම.

- ක්‍රීඩා වෛද්‍ය ආයතනය ආදායම් උත්පාදක ආයතනයක් බවට පත් කිරීම.

# කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

# 2024

## ප්‍රගති වාර්තාව

## කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

## 01. හැඳින්වීම

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සජීවී දායකත්වයක් ලබාදිය හැකි අභිමානවත් තරුණ පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරිව කටයුතු කරන අතර, තරුණ පරපුර තුළ ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කරමින් ශ්‍රී ලාංකික ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමේ කාර්යයෙහි නිරත ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කරනු ලබයි.

1982 වර්ෂයේදී යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලද මෙම අංශය මේ වන විට කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්ව සංවර්ධන ක්ෂේත්‍රය තුළ දශක හතරක පමණ අත්දැකීම් සහිතව කටයුතු කරයි. එමෙන්ම දිවයිනේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් ආයතනයේ සේවාවන් ව්‍යාප්ත කර ඇති අතර, මෙම අංශයේ ආයතනගත හා ක්ෂේත්‍රගත කාර්ය මණ්ඩලය 1,049කි.

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර තුළ පිහිටුවා ඇති අතර, සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර බිම් මට්ටම දක්වා ව්‍යවසායකත්ව සංවර්ධන සේවාවන් ව්‍යාප්ත කර ඇත. එමෙන්ම, ව්‍යවසායකත්ව සංවර්ධනයට අදාළ සියලු ආයතන හා ඒකාබද්ධව, ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ ක්‍රියාත්මක කිරිම කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත.

දිස්ත්‍රික් කාර්යාලයන්හි කටයුතු කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 420 දරන ස්ථානයේ පිහිටි කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යාලය මගින් අධීක්ෂණය කරනු ලබන අතර, සියලුම දිස්ත්‍රික්කයන්හි අධීක්ෂණ නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටුකරනු ලබන ව්‍යවසායකත්ව සංවර්ධන සේවාවන් අධීක්ෂණය කරනු ලැබේ.

## 02.දැක්ම

තිරසර සංවර්ධනය සඳහා ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර සංවර්ධනය

## 03.මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයට උපරිම දායකත්වයක් ලබාදීම සඳහා,

- රැකියා විරහිත තරුණ පෙළ තුළ ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම
- තරුණ තරුණියන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කරවීම
- ව්‍යාපාරවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම
- ව්‍යාපාර සංවර්ධනයට අදාළ සහාය සේවාවන් සැපයීම

## 04.අරමුණු

- තරුණ තරුණියන් තුළ ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම තුළින් දේශීය ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- නව රැකියා අවස්ථා හඳුනාගැනීම හා ව්‍යාපාර ආරම්භ කිරීමට මගපෙන්වීම තුළින් තරුණ තරුණියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
- තරුණ ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම තුළින් තරුණ තරුණියන්ට වැඩි රැකියා අවස්ථා ලබාදීම සහ ආදායම් වර්ධනය කිරීම.

- ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාරවල ඵලදායිතාව යහපැවැත්ම සහතික කිරීම සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීම.

**05.ප්‍රධාන කාර්යයන්**

**කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ,**

- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පුද්ගලයින් පෙළඹවීම සහ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සහායවීම.
- ව්‍යවසායකයින් තම ව්‍යාපාර පවත්වා ගෙනයාමේදී මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා මැදිහත්වීම තුළින් පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම.

මෙම කාර්යභාරය වඩා විධිමත්ව සිදුකිරීම උදෙසා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නිර්දේශිත ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ආයතනයේ කාර්යභාරය ව්‍යුහගතකර ඇත.

- ව්‍යවසායකත්ව හා කුසලතා සංවර්ධනය
- අලෙවි පහසුකම් ප්‍රවර්ධනය
- තාක්ෂණය හා නව්‍යකරණය
- මූල්‍ය පහසුකම් වෙත ප්‍රවිශ්‍යය හා සහායක සේවා සම්බන්ධීකරණය
- ව්‍යාපාර උපදේශනය
- පර්යේෂණ හා සංවර්ධනය

**07.සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු /අතිරික්තය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 37 | 34 | 3 |
| තෘතියික | 151 | 106 | 45 |
| ද්විතියික | 920 | 860 | 60 |
| ප්‍රාථමික | 70 | 49 | 21 |
| **එකතුව** | **1,178** | **1,049** | **129** |

| **අනු අංකය** | **වැඩසටහනේ නම** | **වෙන්කළ මුදල (රු.මි.)** | **2024.12.31 ට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය (%)** | **භෞතික ප්‍රගතිය (%)** |
|---|---|---|---|---|---|
| 01 | තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන | 190.00 | 140.666 | 74 | 79 |

*තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම්වලට අදාළව එක් එක් ඒකකයන්හි ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

| ඒකකය | වෙන්කළ මුදල (රු.මි) | 2024.12.31 ට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| ව්‍යවසායකත්ව සංවර්ධන ඒකකය | 39.74 | 42.71 | 107 | 66 |
| තාක්ෂණය හා නව්‍යකරණ ඒකකය | 34.69 | 30.91 | 89 | 111 |
| අලෙවි සංවර්ධන ඒකකය | 77.50 | 44.82 | 58 | 160 |
| මූල්‍ය හා සහාය සේවා ඒකකය | 17.76 | 14.14 | 80 | 36 |
| ව්‍යාපාර උපදේශන ඒකකය | 7.39 | 1.79 | 24 | 23 |
| පර්යේෂණ හා සංවර්ධන ඒකකය | 12.91 | 6.28 | 49 | 19 |
| **එකතුව** | **190.00** | **140.66** | **74** | **79** |

***** තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන වෙනුවෙන් වෙන්කරන ලද රු.මි.350න් වාර්ෂික ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනුමත කරන ලද රු.මි.190ට අදාළව පමණක් ප්‍රගතිය දක්වා ඇත. (Development Assistance ව්‍යාපෘතිය සඳහා යෝජිත රු.මි.160 වෙනුවෙන් මෙතෙක් NPD අනුමැතිය නොලැබීම හේතුවෙන්)

**08.වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය 2024.12.31 දිනට**

| විස්තරය | වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රු.මි.) | % |
| පුනරාවර්තන වියදම | 856.825 | 768.67 | 89.71 |
| ප්‍රාග්ධන වියදම | 480.000 | 230.4 | 48 |
| එකතුව | 1336.825 | 966.361 | 72 |

**09.2024 වර්ෂය තුළ ලබාගත් ඉලක්ක හා විශේෂ ජයග්‍රහණ**

- ❖ තරුණ සවිබලගැන්වීමේ වැඩසටහන හරහා ලඟාකරගැනීමට හැකි වූ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්ගේ සාධනය පහත පරිදි දැක්විය හැකිය.

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ඉලක්කය | ඉලක්ක සාධනය | % |
|---|---|---|---|---|
| 01 | නව ව්‍යාපාර ආරම්භ කිරීම | 14,000 | 12,272 | 87 |
| 02 | පවත්නා ව්‍යාපාර සංවර්ධනය | 14,000 | 10,095 | 72 |

❖ මෙම ඉලක්ක සාධනයෙහි ලා රට පුරා ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ අතුරින් තෝරාගත් ක්‍රියාකාරකම් කිහිපයක් පිළිබඳ තෙරතුරු පහතින් ඉදිරිපත් කර ඇත.

2024 වර්ෂයේදී ආරම්භ කරන ලද නව ව්‍යාපාර කිහිපයක්





















## දැනුවත් කිරීම් සහ ව්‍යාපාර සඳහා පෙළඹවීමේ වැඩසටහන්

2024 වර්ෂය තුළ සෑම වසමක්ම ආවරණය වන පරිදි නව ව්‍යාපාර 14,000 ක් සහ පවතින ව්‍යාපාර 14,000 ක් සංවර්ධනය කිරීම සඳහා ඉලක්ක පිහිටුවා ගන්නා ලදී. ඒ අනුව එම පිරිස හඳුනා ගැනීම සඳහා විවිධ ක්‍රම ඔස්සේ දැනුවත් කිරීම් සිදුකළ අතර දැනුවත් කිරීමේ වැඩසටහන්, සමාජ මාධ්‍ය හරහා දැනුවත් කිරීම් සහ ක්ෂේත්‍රයේ නිරත නිලධාරීන් හරහා දැනුවත් කිරීම් සිදුකරන ලදී. මෙම ක්‍රම 3 ඔස්සේ සිදුකරන ලද දැනුවත් කිරීම් සඳහා 2024.12.31 දිනට දැනුවත් වූ පිරිස 141,650 ක් විය.

මෙම දැනුවත් කිරීම් සඳහා සම්බන්ධ වූ පිරිස වෙනුවෙන් ව්‍යාපාර සඳහා පෙළඹවීමේ වැඩසටහන් සැලසුම් කළ අතර, ඒවා මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙන්ම භෞතිකවද පවත්වන ලදී.

| වැඩසටහන | සහභාගිත්වය | වියදම (රුපියල්) |
|---|---|---|
| ව්‍යාපාර සඳහා පෙළඹවීමේ වැඩසටහන් (මාර්ගගත) | 1,670 | 20,519.00 |
| ව්‍යාපාර සඳහා පෙළඹවීමේ වැඩසටහන් (භෞතික) | 22,879 | 2,566,739.10 |
| විශේෂ ව්‍යාපෘති ඉලක්ක කරගනිමින් පවත්වන ලද වැඩසටහන් (භෞතික) | 2,360 | 260,187.00 |
| **එකතුව** | **26,909** | **2,847,445.10** |

පවත්නා ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපාර ආරම්භ කිරීම අතිශය වැදගත් කරුණක් බැවින් මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිස වෙනුවෙන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කරන ලදී. එමෙන්ම ඒ සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දායකත්වය, වර්ථමානයේ ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර අවස්ථා පිළිබඳවද සහභාගීවූ පිරිස දැනුවත් කරනලදී.






- <u>Z පන්තිය - ව්‍යවසායකත්වයට අදාළ විශේෂ ක්ෂේත්‍රයන් ඔස්සේ සිදුකරනු ලබන මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන</u>

  රටේ පවතින අර්බුධකාරී තත්ත්වයන්ට මුහුණ දෙමින් අභියෝග ජයගැනීම සඳහා ව්‍යවසායකයින්ට අවශ්‍ය යාවත්කාලීන තොරතුරු ලබාදීම සඳහා ආරම්භ කරනු ලැබූ වැඩසටහනක් ලෙස Z පන්තිය_හඳුන්වා දිය හැකිය. ඒ හරහා ව්‍යවසායකයින්ට අවශ්‍ය දැනුම මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීමට 2024 වර්ෂයේදී කටයුතු කෙරුණි. මෙය සතියේ දින 5 තුළ පෙ.ව. 10.00 - 12.00 දක්වා පැවැත්වෙන වැඩමුළුවක් ලෙස පවත්වන ලදී.

| 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|
| පවත්වන ලද මාර්ගගත වැඩසටහන් සංඛ්‍යාව | 219 |
| මුළු සහභාගීත්වය | 8,400 |

**මාර්ගගත වැඩසටහන් සඳහා නිර්මාණය කරන ලද දැන්වීම්**



















- වසාවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන - Entrepreneurship Development Training Program (EDP)

  ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් අප ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රමුඛතම වැඩසටහනක් ලෙස මෙය හැඳින්විය හැකිය. 1989 වර්ෂයේ සිට අප අංශය මෙම වැඩසටහන පවත්වනු ලබන අතර, ආරම්භයේ දී එය දින 21 ක නේවාසික වැඩසටහනක් ලෙස පවත්වන ලදී. එහෙත් වර්තමානයේ දී ව්‍යාපාරිකයින්ගේ කාර්ය බහුලත්වය සහ නොකඩවා දින 21 ක් සහභාගී වීමේ අපහසුතාවය හේතුවෙන් එය අදියර දෙකක් ඔස්සේ පැවැත්වීමට සැලසුම් කරන ලදී. ඒ අනුව මුල් දින 12 පුද්ගල සංවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධයෙන් ද දින 04 ක් ව්‍යාපාර සැලසුම් සකස් කිරීම සඳහා ද වශයෙන් මෙම වැඩසටහන සංශෝධනය කර ඇත.

| | |
|---|---|
| භෞතිකව පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 19 |
| මුලු සහභාගීත්වය | 564 |
| වියදම (රුපියල්) | 23,647,682.00 |





















- **ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ අලෙවි ප්‍රදර්ශන**

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සහාය දිස්ත්‍රික් මට්ටමින් නිර්මාණය කර ඇති FB Pages හරහා සිදුකරන අතර, ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ලෝගෝ, ලේබල් නිර්මාණය කිරීම, සහ Visiting Card නිර්මාණය කරගැනීම සඳහා අවශ්‍ය සහාය ද අලෙවිකරණ ඒකකය හරහා සිදුකරනු ලැබේ. මීට අමතරව පාරිභෝගික සත්කාරය වැනි වැඩසටහන් හරහා සාර්ථක අලෙවිකරුවෙක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුවත්භාවයද ව්‍යවසායකයින් තුළ ඇතිකිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

| | |
|---|---|
| 2024.12.31 වනවිට අලෙවි ප්‍රදර්ශන සඳහා සහභාගී වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 36,714 |
| වියදම (රුපියල්) | 34,052,888.15 |







**10.ඉදිරි ඉලක්ක 2025-2028**

- නව ප්‍රවණතා හා නව ව්‍යාපාරික අදහස් හඳුන්වාදීම තුළින් තරුණ ප්‍රජාව ව්‍යවසායකත්වය වෙත අභිප්‍රේරණය කිරීම.
- ව්‍යවසායකයින් තුළ නායකත්වය, මෘදු කුසලතා සංවර්ධනය කිරීම තුළින් ව්‍යාපාර ලොව නායකයින් බිහිකිරීම.
- කුඩා ව්‍යාපාරිකයින්ගේ නිෂ්පාදන පිළිබඳ තොරතුරු ඇතුලත් විද්‍යුත් නාමාවලි සකස්කිරීම.
- මාර්ගගත අලෙවිකරණය ප්‍රවර්ධනය කිරීම හා අලෙවි සබඳතා ගොඩනැගීම.

- ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ අලෙවි පොල හා ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
- නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීමට  අවශ්‍ය සේවාවන් ලබාදීම (සහතිකකරණය, නව තාක්ෂණය,  ඇසුරුම්කරණය .... )
- මූල්‍ය පහසුකම් ලබාදීම, මූල්‍ය සාක්ෂරතාවය හා විනය ඇතිකිරීම.
- Z පන්තිය හරහා මාර්ගගත වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීම.
- ප්‍රාදේශීය අමුද්‍රව්‍ය හා තාක්ෂණය යොදාගනිමින් ආරම්භ කළහැකි විශේෂ ව්‍යාපෘති සඳහා තරුණයින් යොමු කිරීම.
- ව්‍යාපාර ගැටලු විසඳීම සඳහා කටයුතු කිරීම.
- ව්‍යාපාර සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි සමීක්ෂණ සිදුකිරීම.
- සංවර්ධන සහාය ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ව්‍යවසායකයින් සහ ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වත්කම් ලබාගැනීමට සහායවීම.
- නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.
- ආයතනය මගින් ලබාදෙන සේවාවන් නියාමනය හා අධීක්ෂණය.